# වාර්ෂික වාර්තාව

2016

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන


1.දැක්ම, මෙහෙවර ,අරමුණ

2.හැදින්වීම

3.සභාපතිතුමාගේ පණිවිඩය

4.කාර්යසාධනය සහ ප්‍රගති සමාලෝචනය

5.අවසාන ගිණුම්

6.විගණකාධිපති වාර්තාව

**<u>දැක්ම</u>**

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

**<u>මෙහෙවර</u>**

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක් ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

**<u>අරමුණු හා පරමාර්ථ</u>**

1. ප්‍රදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක,ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. පිටකොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහ කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මාර්ගස්ථ ගබඩාව පවත්වාගන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

## හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනයකරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගීන් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1994 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අපේක්ෂිත ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවිය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂනයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් “2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත” මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

## සභාපතිතුමාගේ පණිවුඩය

රටපුරා ප්‍රවාහන පහසුකම් සැපයීමේදීපොදු බස් මගී ප්‍රවාහනය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2016 වසරේදී ශ්‍රිලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රිලංගම) මුළු ධාවන කිලෝ මීටර් ප්‍රමාණය මිලියන 451.5 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 2.5% කින් ඉහළ ගියේය. මුළු මගී කිලෝ මීටර් ප්‍රමාණය කිලෝ මීටර් බිලියන 16.1 දක්වා 6.1%කින් ඉහළ ගියේය.

2016 වසරේදී අගෝස්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික බස් ගාස්තු සංශෝධනය මගින් අවම බස් ගාස්තුව රුපියල් 08.00 සිට රුපියල් 09.00 දක්වා 6% කින් ඉහළ දමන ලදී.

ගර්භිත පැරණි බස් රථ ඉවත් කිරීම සඳහා 2016 වසර තුලදී ශ්‍රිලංගම විසින් වෙන්දේසි මාලාවක් සිදු කරන ලදී.එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසර අවසාන වන විට ශ්‍රිලංගම සතු මුළු බස්රථ සංඛ්‍යාව 7,781 දක්වා බස්රථ 266කින් අඩුවිය. වසර තුලදී පවතින බස්රථ ප්‍රතිසංස්කරණය හා අළුත්වැඩියා සඳහා ශ්‍රිලංගම විසින් රුපියල් මිලියන 1,069 ක් වැය කරන ලදී. එම වියදම මුල්‍යනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 800 ක් ලබා දෙන ලදි. මීට අමතරව, ශ්‍රිලංගම බස්රථ ඇණිය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය විසින් කඩිනම් ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර, ඒ යටතේ බස්රථ 87 ක් ප්‍රතිසංස්කරණය කෙරුණි.

නව බස්රථ ගමන්වාර හඳුන්වා දීමත්, මින් පෙර නවතා දමා තිබූ ඇතැම් ගමන්වාර නැවත ආරම්භ කිරීමත්, හේතුවෙන් ශ්‍රිලංගම විසින් දෛනිකව ධාවනය කරන ලද බස්රථ සංඛ්‍යාව සාමාන්‍ය 2015 වසරේදී ධාවනය වූ 5284 ට සාපේක්ෂව 2016 වසරේදී 5315 ක් දක්වා ඉහළ ගියේය.

පෞද්ගලික අංශය විසින් සපයනු නොලබන සාමාජීය සත්කාරක ප්‍රවාහන සේවා සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රිලංගම යටතේ සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. ඒ අනුව, පාසල් සිසුන්ට පහසුකම් සැලසීම සඳහා 2016 වසර අවසානය වන විට සිසු සැරිය බස්සේවා 1,299 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුනි. තවද, විධිමත් ප්‍රවාහන මාධ්‍ය ක්‍රම නොමැති ග්‍රාමීය ප්‍රදේශවලට ලාභදායි හා විශ්වාසනීය ප්‍රවාහන සේවා සැපයීම සඳහා 2016 වසර අවසානය වන විට ගැමි සැරිය බස් සේවා 10 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුනි. මීට අමතරව, රාත්‍රි කාලයේ හා හිමිදිරි උදෑසන ගමන්ගන්නා මගීන්ට විශ්වාසනීය හා ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා 2016 වසර අවසානය වන විට නිසි සැරිය බස් සේවා 123 ක්ද ක්‍රියාත්මක විය. ඒ අනුව 2016 වසර තුලදී පිටකොටුව මධ්‍යම බස්රථ නැවතුම්පොලේ සිට ආරම්භ වන රාත්‍රි නගරාන්තර ගමන්වාර 29 ක් නැවත ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

2016 වසර තුලදී ශ්‍රී ලංගම හි මුළු ආදායම රුපියල් බිලියන 40.9 දක්වා පෙර වසරට සාපේක්ෂිතව 14.2 ක වර්ධනයක් වාර්තා කළේය. මුළු ආදායමට 65.6 ක් පමණ දායකත්වයක් සැපයූ මගී ගමන් ගාස්තු වලින් ලද ආදායම් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී 7.4% කින් ඉහළ ගියේය. මෙහි වියදම්ද රුපියල් බිලියන 42 ක් දක්වා 3.6% කින් ඉහළ ගියේය. ඒ හේතුවෙන් ශ්‍රිලංගම 2015 වසරේදී වාර්තා කළ රුපියල් බිලියන 4.7 ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂිතව 2016 වසරේදී රුපියල් බිලියන 1.1 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය.

2016 වසරේදී හිඟව තිබූ ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් හා අනෙකුත් බැරකම් ක්‍රමානුකූලව පියවා ගියේය. යහපාලන රජය උදාවීමෙන් අනතුරුව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය, මුදල් අමාත්‍යංශය, ශ්‍රිලංගම නිලධාරින් හා සම්බන්ධ අනෙකුත් භාරකරු සාකච්ඡා කීපයක් පවත්වා එම සාකච්ඡාවලින් ගත් තීරණය පදනම් කරගෙන ප්‍රතිව්‍යුහගත සැලසුමක් සාදන ලදි. මෙම සැලසුමේ මතුවී පෙනෙන වැදගත් කරුණුවූයේ සිය කැමැත්තෙන් විශ්‍රාම යැවීමේ පටිපාටිය යටතේ විශ්‍රාම යැවීමයි.

ඒ අනුව වියදම් අඩු කිරීමටත් අතිරික්ත සේවකයින්ගේ ප්‍රශ්න විසඳීමටත් සිය කැමැත්තෙන් විශ්‍රාම යන පටිපාටියේ නියමයන් හා කොන්දේසි විස්තර ඇතුල් කර ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව 2016 වසරේදී ඉහත සඳහන් පටිපාටිය ක්‍රියාත්මක කරන ලදී.

2016 වසරේදී සිය කැමැත්තෙන් විශ්‍රාම යෑමේ පටිපාටිය යටතේ සේවකයින් 3457 ක් ඉල්ලුම් කරන අතර එයින් ඉල්ලුම් පත්‍ර 68 ක් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප විය. 2389 සේවකයින් සිය කැමැත්තෙන් විශ්‍රාම යවා ඔවුන්ට හිමි වන්දි මුදල, පාරිතෝෂික හා අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා නිම කරන ලදී. එම නිසා ශ්‍රී ලංගම වියදම සැහෙන ප්‍රමාණයකට අඩුවී දැනට ලාභ ලබන තත්ත්වයකට පැමිණ ඇත.
ශ්‍රීලංගම ලාභ ලබන ආයතනයක් වශයෙන් පරිවර්ථනය කිරීමට සහාය දැක්වූ ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්ට හා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ,SEMA හා අනෙකුත් ආයතනයන්ගේ නිළධාරින්ටද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරන අතර මා හට නොමසුරු සහයෝගය ලබා දුන් ශ්‍රීලංගම සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ටත් මාගේ ස්තූතිය පල කරමි.

**රමාල් සිරිවර්ධන**

**සභාපති**

**ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලය**

## ලේකම් කොට්ඨාශය

**2016 වර්ෂයේ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

**2016 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන**

| | | |
|---|---|---|
| 01 වන රැස්වීම | - | 2016.01.06 |
| 02 වන රැස්වීම | - | 2016.02.02 |
| 03 වන රැස්වීම | - | 2016.03.03 |
| 04 වන රැස්වීම | - | 2016.03.31 |
| 05 වන රැස්වීම | - | 2016.05.05 |
| 06 වන රැස්වීම | - | 2016.06.02 |
| 07 වන රැස්වීම | - | 2016.07.05 |
| 08 වන රැස්වීම | - | 2016.08.10 |
| 09 වන රැස්වීම | - | 2016.09.06 |
| 10 වන රැස්වීම | - | 2016.10.04 |
| 11 වන රැස්වීම | - | 2016.11.08 |
| 12වන රැස්වීම | - | 2016.12.08 |

2016 වර්ෂය තුළ විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දෙක ඇතුලු අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 14 ක් පැවැත්වේ.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහත අධක්‍ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාල කටයුතු**

1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන දිනය සඳහන් කර සියලුම අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා ශ්‍රී ලංගම කොට්ඨාශ/ අංශ ප්‍රධානීන් වෙත නිවේදන නිකුත් කිරීම.

2. අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා භාරගෙන පත්‍රිකා අංක යොදා ලේඛනගත කිරීමෙන් අනතුරුව ගොනු සකසා, අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත භාරදීම.

3. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අධ්‍යක්‍ෂ මණ්ඩලීය පත්‍රිකා පිළිබඳව හා චක්‍ර ලිපි පිළිබඳව සඳහන් කර අධ්‍යක්‍ෂ මණ්ඩලීය රැස්වීමේ න්‍යාය පත්‍රය සැකසීම.

4. න්‍යාය පත්‍රයට අනුව හා සභාපතිතුමාගේ උපදෙස් මත අධ්‍යක්‍ෂ මණ්ඩලීය පත්‍රිකා හා චක්‍රලිපි සභාගත කිරීම.

5. ඒ ඒ අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවට හා චක්‍ර ලිපියට අදාලව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය හා ආනුෂංගික උපදෙස් නිවැරදිව වාර්තා කර අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණ අයිතම අංක අනුව සටහන් කිරීම.

6. එසේ සටහන් කළ අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් වලට අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසු එම අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් වල උධෘතයන් එම අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කළ යුතු ශ්‍රී ලංගම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන් වෙත භාරදීම.

7. මෙම සියලුම කටයුතු නිවැරදිව, රහස්‍යභාවයෙන් යුතුව හා විධිමත්ව ඉටු කිරීම.

8. ශ්‍රී ලංගම අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනා ලද කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත සංග්‍රහ ලබාදීම.

9. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්‍ෂ මණ්ඩලීය සාමාජිකයන්ට සහභාගීත්ව දීමනා ගෙවීමේ කටයුතු සිදු කිරීම.

10. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේ කටයුතු සිදු කිරීම.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉඩකඩම් වලට අදාල කටයුතු ඉටු කිරීම**

1. අවු: 32 ක කාලයක සිට ශ්‍රී ලංගමට ලබාගත නොහැකිව තිබූ ගහ අද්දරවත්ත ඉඩමේ අයිතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව හා මෙම ඉඩමේ පර්චසයක් රුපියල් කෝටි 01 යි පන් ලක්ෂයක් බව සැලකේ.

2. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක්වෙනුවෙන්ශ්‍රීලංගමය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සමඟ කොන්දේසි සහිතව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන ශ්‍රී ලංගමය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව අතර වර්ෂ 2017/01/25 සිට 2018/01/24 දින දක්වා වර්ෂයක කාලයකට ගිවිසුමකට එළඹ ඇත. වර්ෂයක බදු කුලිය වශයෙන් රු. 2,260,000/- ක් වටිනා චෙක්පත් අංක 070132 – දරණ 2017/08/14 දිනැති චෙක්පතෙන් ඉහත බදු කුලිය ගෙවා ඇත. ඒ සඳහා ශ්‍රී ලංගම මුදල් භාරගැනීමේ කුවිතාන්සි අංක 147298 නිකුත් කර ඇත.

3. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් ප්‍රමුඛතාව දෙමින් ශ්‍රී ලංගමය හා කේ.ඩී.ර්බට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සමඟ අයිතීන් සුරකෙන පරිදි කොන්දේසි සහිතව ඇති කරගත් ගිවිසුමට අනුව මාතලේ ප්‍රාදේශීය වැඩපොළ පිහිටි භූමියෙන් බෙදාවෙන්කළ ඉඩම් කොටසේ වාහන අලුත්වැඩියාව හා භාණ්ඩ ගබඩා කිරීම සඳහා ඉදිකිරීම් සම්බන්ධයෙන් 2016 මාර්තු 16 දින වර්ෂ 02 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. අදාළ සමාගම විසින් චෙක්පත් අංක 055158 හා රු.960,000.00 වටිනා චෙක්පතත් බදුකුලිය වශයෙන් අයකරගෙන ඇත.

4. ශ්‍රී ලංගම හා පිටකොටුව මධ්‍යම බස්රථ සංකීර්ණයෙහි පිහිටි මගී ලැඟුම්හල ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදුකුළිය ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා 2015 දෙසැම්බර් 21 දින අත්සන් තබන ලද බදු ගිවිසුම් ප්‍රකාරව මුදල් අයකර ගැනීම.( රු.120,000 x 12 - රු.1,440,000/- )

   මධ්‍යම බස්රථ කාර්යාල පරිශ්‍රයෙහි පිහිටි වෙළඳ ව්‍යාපාරයන්හි බදු ආදායම් ගාස්තු සංශෝධනය කිරීම සඳහා 2016 මැයි මස 01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංගම සභාපතිතුමාගේ අනුමැතිය ලබාදී ඇත.

| | |
|---|---|
| 2016 මාර්තු මස 1 දින සිට කඩකාමර සංශෝධිත මිල | රු. 985042.46 |
| කඩකාමර සඳහා පෙර පැවති කුලිය | රු. 553805.16 |
| සංශෝධනය අනුව වැඩි වූ කුලිය | රු. 431237.30 |

2016 වර්ෂයේ මධ්‍යම බස්රථ කාර්යාලයෙහි වෙළඳ ව්‍යාපාර සඳහා වෙළඳ ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධයෙන් නීති කොට්ඨාශයට යොමු කර ඇත

**රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරිය 454) වගන්තිය යටතේ :**

5. මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලක්ෂපතියේ වෙලෝනාවත්ත නැමති බිම් කැබැල්ල(හෙක්ටයාර් 7.6381 ) සඳහා 2016 ජූනි මස 03 වෙනි දින ශ්‍රී ලංගමය වෙත කිසිදු ගෙවීමකින් තොරව නිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත.

6. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාම්පේ හෙක්ටයාර් 0.3306 ක් වූ ඉඩම 2016/05/25 දින ශ්‍රී ලංගමය වෙත කිසිදු ගෙවීමකින් තොරව නිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත. (පිළියන්දල බස්නැවතුම්පළ)

7. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හොන්නන්තර කුරුදුගහවත්ත නැමති බිම් කොටස ශ්‍රී ලංගමය වෙත 2016/05/25 දින කිසිදු ගෙවීමකින් තොරව නිදහස් දීමනා ප්‍රදානය කොට ඇත. (කැස්බෑව ඩිපෝව) (හෙක්ටයාර් 2.9119)

8. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වේරහැර, ගොඩපරගහවත්ත හා ගමගේදෙණිය බිම් කොටස ශ්‍රී ලංගමය වෙත 2016/05/25 දින ශ්‍රී ලංගමය වෙත කිසිදු ගෙවීමකින් තොරව නිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත. (වේරහැර) (හෙක්ටයාර් 26.2683)

9. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැන්දලන්ද නැමති බිම් කොටස 2016 මැයි 25දින ශ්‍රී ලංගමයට කිසිදු ගෙවීමකින් තොරව නිදහස් දීමනා ප්‍රදානය කොට ඇත. (හෝමාගම) (හෙක්ටයාර් 2.0774)

10. මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොඩිගමුව නැමති තහනම් කැලේවත්ත බටදොඹගහවත්ත බිම් කොටස ශ්‍රී ලංගමය කිසිදු ගෙවීමකින් තොරව 2016 මැයි 25 දින නිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත.(මහරගම) (හෙක්ටයාර් 2.0823)

11. මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෙලවල ගමෙහි අඹබෝගහවත්ත බිම් කොටස 2016/05/25 දින ශ්‍රී ලංගමයටනිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත. (ජර්මන්ටෙක්) (හෙක්ටයාර් 4.1868)

12. මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෙලවල ගමෙහි ලේඩි කැතරින්වත්ත බිම් කොටස 2016/05/25 දින ශ්‍රී ලංගමයටනිදහස් දීමනාව ප්‍රදානය කොට ඇත. (මොරටුව රියදුරු අභ්‍යාස විද්‍යාලය) (හෙක්ටයාර් 0.7910)

13. ශ්‍රී ලංගම ඇඹිලිපිටිය ඩිපෝ ඉඩම සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරිය 454) පනත යටතේ නිදහස් දීමනා පත්‍රයක් ලබාගැනීම සඳහා මැනුම් කර පිඹුරුපත් සකසා මේවන විට ඔප්පුව ලබාගෙන ඇත.

14. කළුතර ඩිපෝව පුළුල් කිරීම සඳහා අත්කරගෙන ඇති අක්කර 04 ක බිම් කොටස සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලබාගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර, ලැබීමට නියමිතව ඇත.

15. කැස්බෑව ඩිපෝ ඉඩමෙන් මාර්ග සංවර්ධනය සඳහා යන බිම් කොටස සඳහා වන්දි හිමිකම් සඳහා සහභාගි වීම මගින් මේවන විට රු.40,000,000/- ක මුදලක් ශ්‍රී ලංගම වෙත වෙන්කර ඇති අතර, මිලියන 14 ක මුදලක් භාරදී ඇත.

16. ශ්‍රී ලංගම ඔරුගොඩවත්ත ඉන්ධන හල භූමියෙන් මාර්ග සංවර්ධන කටයුතු සඳහා පැවරී ඇති බිම් කොටස සඳහා වන්දි හිමිකම් සඳහා සහභාගි වී ශ්‍රී ලංගම අයිතීන් සුරැකීමට කටයුතු කිරීම. එමගින් මේවන විට සංවර්ධන වටිනාකම මත රු.4,638,500/- ක් හා ව්‍යාපාරික ආලාභය රු.3,286,000/- ක් ඔබ කොට්ඨාශය මගින් භාරගෙන ඇත.

17. මට්ටක්කුලිය ඩිපෝ ඉඩම සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබාගැනීම සඳහා කටයුතු සිදුකරමින් මේවන විට ලබාගැනීමට නියමිත වී ඇත.

18. කොත්මලේ ඩිපෝ ඉඩම සම්බන්ධව අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයෙන් මුදාගෙන එකී ඉඩම සඳහා වන්දි ගෙවූ බවට ලිපි ලේඛන මගින් තහවුරු කර44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ඉල්ලීම් කිරීම මේවන විට ලබාදීම සඳහා අනුමත වී ඇත.

19. ශ්‍රී ලංගම වෙන්නප්පුව ඩිපෝ ඉඩමේ තෙල් සංස්ථාව වෙත 1987 බදු ලබා දී ඇති ඉඩම් කොටස සඳහා වර්තමාන වෙළඳපොළ වටිනාකම යටතේ රජයේ තක්සේරු වටිනාකම අයකර ගැනීම සඳහා මෙම ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා අදාළ ලිපිලේඛන හා අදාළ ගැසට් පත්‍රයෙහි වන්දි ගෙවූ බවට ලේඛන අධ්‍යයනය කර තහවුරු කිරීම මගින් ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පැවරුම් සහතිකය ප්‍රාදේශීය ලේකම් මගින් ඉල්ලුම් කර මේවන විට ශ්‍රී ලංගම අයිතිය පිළිගෙන ඇත. තවද තෙල් සංස්ථාවට බදු ලබාදී ඇති බිම් කොටස සඳහා රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇත.

20. ඇල්පිටිය ඩිපෝ ඉඩමෙන් පර්චස් 140 ක් පොලිස් දෙපාර්තමේන්තුවට ලබාදීම ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි මැනුම් කර පිඹුරුපත් සකසා රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන එම මුදල ශ්‍රී ලංගම වෙත අයකරගෙන මුදාහැරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගෙන පවරාදීමේ කටයුතු මේවන විට සිදුවේ.

21. තවද ඇල්පිටිය ඩිපෝ ඉඩමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව අක්කර 01 ක් මැනුම් කර පිඹුරුපත සකසා අවසන් කර රජයේ තක්සේරු වාර්තාවක් ලබාගැනීම සඳහා මේවන විට කටයුතු කර ඇති අතර මුදාහැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

22. ගම්පහ බැණ්ඩියමුල්ල ඉඩමෙන් පර්චස් 27 ක් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෙත පවරාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබාගෙන එකී තීරණ පරිදි මැනුම් කර පිඹුරුපත් සකසා නාගරික සංවර්ධන අධිකාරියේ අවසර ගෙන රජයේ තක්සේරු වටිනාකම වන රු.20,250,000/- ක මුදලක් මේවන විට ලබාගෙන ඇත.

23. ශ්‍රී ලංගම ගම්පහ ඩිපෝ ඉඩමෙන් අක්කර 02 පර්චස් 38.4 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා මැන පිඹුරුපත් සකසා ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු ලබාගෙන ඇත. ඒ අනුව රජයේ තක්සේරු වටිනාකම රු.432,000,000/- ක් වේ.ඒ අනුව මුදාහැරීමේ කටයුතු සිදුවේ.

24. ඒකල ප්‍රාදේශීය වැඩපළ පිහිටි අක්කර 24 ඉඩම සඳහා 44 වගන්තිය යටත් පැවරුම් සහතික ලබාගැනීම සඳහා මැනුම්කර පිඹුරුපත් සකස් කර ඒසඳහා කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේවන විට 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලියාපදිංචි කිරීම සඳහා යොමු කර ඇත.

25. මාතලේ නගර සභාව වෙත මාර්ගයක් පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංගම මාතලේ ඩිපෝ ඉඩමෙන් පර්චස් 2.83 ක් පවරාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබාගෙන මැනුම්කර පිඹුරුපත් සකසා රජයේ තක්සේරු වාර්තාවක් මේවන විට ලබාගැනීමට කටයුතු සිදුකොට ඇත.

26. ශ්‍රී ලංගම බදුල්ල තන්තිරිගේවත්ත ඉඩමෙන් පර්චස් 60.5 ක් කම්කරු දෙපාර්තමේන්තුවට පවරාදීම සඳහා කරන ලද ඉල්ලීම පරිදි ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර එකී අනුමැතිය පරිදි බිම් කොටස මැනුම්කර පිඹුරුපත් සකසා තක්සේරු වටිනාකම ශ්‍රී ලංගම වෙත අයකර ගැනීමට හැකිවන පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මේවන විට පැවරුම් කටයුතු සිදුවෙමින් පවතී.

27. බදුල්ල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මිලදීගෙන ඇති අක්කර 05 ක ඉඩම් කොටස සඳහා ඔප්පු ලබාදෙන ලෙස ඉල්ලීම් කිරීම ශ්‍රී ලංගම වෙත ඉතිරිව ඇති බිම් කොටස මැන පිඹුරුපත් සකසා ඇති අතර, අධිකරණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අක්කර 02 ක් පැවරීම සඳහා මේවන විට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති අතර, ඒ අනුව තක්සේරු වටිනාකම රු. 40,000,000 /- වේ.

28. ශ්‍රී ලංගම නිට්ටඹුව පැරණි බස් නැවතුම්පළ භූමිය ඉතා වාණිජ වටිනාකමක් සහිත භූමියක් බැවින් එම භූමිය වාණිජ කටයුතු සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබාගත් අතර, ඒ අනුව මැනුම් කර පිඹුරුපත් අංක 7200 පිළියෙල කර රජයේ තක්සේරු වාර්තාවක් ලබාගත් අතර, වාර්ෂික බදු තක්සේරු වටිනාකම 4,500,000/- ක් වේ. බදු දීම සඳහා ක්‍රියාකරමින් පවතී.

29. පානදුර බස් නැවතුම්පොළ භූමිය සම්බන්ධව පානදුර අධිකරණයේ ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංගම පාර්ශවකරුවෙකු වී ශ්‍රී ලංගම අයිතිය තහවුරු කිරීමට හැකිවිම.

30. ශ්‍රී ලංගම හැටන් ඩිපෝ ඉඩමේ අනවසර ඉදිකිරීමක් සම්බන්ධව පැමිණිල්ලට අනුව ඩිපෝ ඉඩම මැනුම්කර පිඹුරුපත් සකසන ලද අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර එකී ගැටලුකාරී තත්ත්වය හමුවේ ශ්‍රී ලංගම අයිතිය තහවුරු කර ඇත.

31. ශ්‍රී ලංගම මධ්‍යම බස්රථ කාර්යාලයේ මහී ලැහුම්හල හේෂාන් කේටර්ස් (පුද්) සමාගමට අවු.05 කට බදු ලබාදීම. මාසික රු.120,000/- බැගින් අයකරගෙන ඇත.

## ආරක්ෂක අංශය

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම අයත් ආයතනයන් වෙත ආරක්‍ෂාව සැපයීම.

2. ශ්‍රී ලංගම අයත් ප්‍රාදේශීය කාර්යාලයන්, ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාලය යන සියලුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කිරීම.

3. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන් වෙත ගිනි නිවන උපකරණ සැපයීම/ අළුත්වැඩියා කිරීම/ අධීක්‍ෂණය කිරීම්.

4. ශ්‍රී ලංගම අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැදීමේදී හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්‍ෂාව ලබාදීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන් වල සේවක මහත්ම/ මහත්මීන් වෙත නිදහස් ගමන් බලපත්‍ර බෙදා හැරීම් කටයුතු සිදු කිරීම.

6. ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි වැදගත් ස්ථාන හා ප්‍රභූ ආරක්‍ෂාව සැපයීම, රථ වාහන නැවැත්වීම, පාලනය කිරීම අදාල ආයතනයන් වෙත කරනු ලබන සියලුම සැපයීම් හා නිකුත් කිරීම් අධීක්‍ෂණය කිරීම.

7. ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් ආයතන වෙත එනම්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික වෛද්‍ය මධ්‍යස්ථානය වෙත ආරක්‍ෂාව සැපයීම හා එමගින් ආදායමක් ඉපැයීම.

## විශේෂ විමර්ශණ ඒකකය

| වර්ෂය | නිම කර ඇති විමර්ශන |
|---|---|
| 2016 | 40 |

2016වර්ෂය සඳහා හදිසි ඩිපෝ පරීක්ෂණ 05 ක් හා බස්රථ පරික්ෂාවන්ද, බස්ගාල් පරික්ෂාවන්ද කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

## ධාවන කොට්ඨාශය

1. 2016 වර්ෂය තුල ධාවනයට ලබාදුන් සාමාන්‍ය බස්රථ ප්‍රමාණය දිනකට 6054 ක් වූ අතර ධාවනයට එක්කරන ලද සාමාන්‍ය බස්රථ ප්‍රමාණය දිනකට 5350 ක් පමණ වේ. දිනකට ධාවනය කළ සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මිලියන 1.3 ක් පමණ වේ. දිනකට උපයනු ලැබූ සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම කිලෝමීටරයකට රු 58 කි.

2. ශ්‍රීලංගම මගින් සපයනු ලබන ප්‍රථම සහ රාත්‍රී ගමන්වාර තරකිරීමත්මගී අවශ්‍යතාවය අනුව එම සේවා වර්ධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

3. ශ්‍රීලංගම බස්රථ සේවා සහ දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම අරමුණ කරගෙන මගී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දුම්රිය ස්ථානවල සිට පවතින සේවා වර්ධනය කිරීමටත් නව සේවා ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

4. සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ සිසුසැරිය බස්රථ සේවාවන් 740 ක්දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇති අතරඉදිරියටත් සිසුන්ගේ සහ පාසල්වල අවශ්‍යතාවය සහ ඉල්ලීම් සලකා බලා මෙම සේවාව තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය විධිවිධාන සකස්කර ඇත.

5. සියළුමබස්රථසඳහාවිද්‍යුත් ටිකට්මැෂින්යොදාගැනීමතුලින්බස්රථ මගින් මගීන්ට සැපයෙන සේවා කාර්යක්ෂමතාවය ඉහල නංවා ගැනීමටත් ඵලදායීතාවය වර්ධනය කරගැනීමටත් හැකියාව ලැබී ඇත.

## සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

### අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර ධාවනය

අළුයම ප්‍රථම සහ රාත්‍රී අවසන් ගමන්වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායකත්වය සෘජුවම දායක වන නමුත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇත්තේ කීර්තිනාමය පමණි. නමුත් ශ්‍රී ලංගම සිදු කරනු ලබන තවත් සමාජීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව මගී ජනතාවගේ සුවපහසුව පිණිස අඛණ්ඩවම ක්‍රියාත්මක කෙරේ.

### ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය

ග්‍රාමීය ආර්ථකය ශක්තිමත් කිරීම සඳහා ගම සහ නගර යා කිරීමේ ප්‍රබලතම ප්‍රවාහන මාධ්‍ය ලෙස සෘජුව දායකත්වයක් ලබාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයයි. මගීන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම සේවා අඛණ්ඩව සැපයීම සඳහා සැම විටම කටයුතු කරන අතර ඉදිරියේදීද නව බස්රථ මිලදී ගෙන මෙම සේවාව වර්ධනය කිරීමට සැලසුම් සකස්කර ඇත්තේ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීමට ග්‍රාමීය ප්‍රවාහනය විධිමත් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

### පාසල් සේවා බස්රථ ධාවනය

ශ්‍රී ලංගම විසින් දැයේ හෙට දිනය වෙනුවෙන් පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා විශාල සේවාවක් ඉටු කරනු ලබයි. මගී අවශ්‍යතාවය වැඩි කාලය තුළ ඉහල ලාභයක් ඉපයීමට හැකියාව ඇති අවස්ථා අහිමි කර ගනිමින් දැයේ අනාගත පරපුර නියමිත වේලාවට පාසලට රැගෙන යාම සහ ආපසු නිවෙස් බලා ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම සතු බස් රථ මගින් ප්‍රශස්ත සේවාවක් සපයනු ලැබේ.

## ජංගම පරීක්ෂණ අංශය

**2016 වර්ශය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (දිවයින පුරා)**

| මාසය | කණ්ඩායම් ගණන | පරීක්ෂණ වාර ගණන | පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (iv) | සුළු විෂමාචාර (v) | දඩ ගෙවූ මගින් ගණන | අයකරගත් දඩ මුදල රු: |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 120 | 1,253 | 17,574 | 100 | 368 | 626 | 220,903.00 |
| පෙබරවාරි | 116 | 1,212 | 15,514 | 67 | 349 | 538 | 185,345.00 |
| මාර්තු | 110 | 1,263 | 17,411 | 68 | 384 | 57 | 192,813.00 |
| අප්‍රේල් | 112 | 1,211 | 22,300 | 75 | 398 | 831 | 295,279.00 |
| මැයි | 92 | 1,079 | 14,080 | 74 | 270 | 440 | 156,998.00 |
| ජූනි | 108 | 1,100 | 16,245 | 92 | 293 | 575 | 199,726.00 |
| ජූලි | 101 | 1,180 | 17,033 | 94 | 337 | 595 | 210,097.00 |
| අගෝස්තු | 101 | 1,194 | 14,949 | 63 | 256 | 509 | 179,747.00 |
| සැප්තැම්බර් | 92 | 1,049 | 15,109 | 61 | 290 | 530 | 183,168.00 |
| ඔක්තෝම්බර් | 107 | 1,196 | 21,791 | 51 | 319 | 762 | 211,268.00 |
| නොවැම්බර් | 65 | 760 | 10,813 | 55 | 226 | 270 | 101,197.00 |
| දෙසැම්බර් | 57 | 803 | 9,600 | 69 | 188 | 299 | 105,377.00 |
| එකතුව | **1,181** | **13,300** | **192,427** | **869** | **3,678** | **6,545** | **2,241,918.00** |

**2016 වර්ශය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (ප්‍රධාන කාර්යාලය)**

| මාසය | කණ්ඩායම් ගණන | පරික්ෂණ වාර ගණන | පරික්ෂා කළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (iv) | සුළු විෂමාචාර (v) | දඩ ගෙවූ මගින් ගණන | අයකරගත් දඩ මුදල රු: |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 05 | 83 | 1,317 | 22 | 34 | 61 | 21,174.00 |
| පෙබරවාරි | 05 | 109 | 1,080 | 16 | 37 | 62 | 20,435.00 |
| මාර්තු | 05 | 87 | 1,337 | 23 | 43 | 61 | 22,027.00 |
| අප්‍රේල් | 06 | 77 | 1,741 | 30 | 61 | 84 | 28,770.00 |
| මැයි | 06 | 76 | 1,079 | 29 | 28 | 42 | 14,638.00 |
| ජූනි | 06 | 64 | 1,305 | 29 | 39 | 68 | 24,246.00 |
| ජූලි | 06 | 89 | 1,591 | 25 | 42 | 59 | 21,412.00 |
| අගෝස්තු | 06 | 95 | 1,515 | 26 | 44 | 66 | 25,661.00 |
| සැප්තැම්බර් | 06 | 76 | 1,393 | 25 | 50 | 56 | 21,036.00 |
| ඔක්තෝම්බර් | 06 | 72 | 1,130 | 21 | 26 | 32 | 10,944.00 |
| නොවැම්බර් | 06 | 64 | 1,126 | 18 | 42 | 48 | 18,766.00 |
| දෙසැම්බර් | 06 | 93 | 1,386 | 26 | 26 | 39 | 12,964.00 |
| **එකතුව** | **69** | **902** | **16,000** | **269** | **472** | **678** | **242,073.00** |

## ඉංජිනේරු කොට්ඨාශය

**2016 වර්ෂයේ බස්රථ පුනුරුප්තාපන ව්‍යාපෘතිය**

| විස්තරය | පුනුරුප් තාපන | | පුනුරුප්තාපනයට අයත් නොවන | | හාභිර ආයතනය මගින් | | ප්‍රාදේශිය වැඩපලවලින් | | | | | | වියදම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අළුත්වැඩියා සිදු කරන / අවසන් | | අළුත්වැඩියා සිදු කරන / අවසන් | | අළුත්වැඩියා සිදු කරන / අවසන් | | එංජින් අළුත්වැඩියා | | ගියර් පෙට්ටි අවත්වැඩියා | | බස් බොඩි අළුත්වැඩියා | | |
| | නිමකල බස්රථ | සම්පූර්න වියදම (රු.) | නිමකල බස්රථ ගණන | සම්පූර්ණ වියදම (රු.) | නිමකල එන්ජින් | සම්පූර්ණ වියදම (රු.) | බස්රථ ගණන | වියදම(රු.) | බස්රථ ගණන | වියදම (රු.) | බස්රථ ගණන | වියදම (රු.) | (රු.) |
| ජනවාරි | 0 | 0.00 | 6371 | 98,264,910.71 | 0 | 0.00 | 30 | 2,828,252.52 | 14 | 707,379.22 | 15 | 1,468,159.00 | 103,268,701.45 |
| පෙබරවාරි | 0 | 0.00 | 3704 | 77,590,388.58 | 0 | 0.00 | 43 | 4,297,323.77 | 14 | 617,993.19 | 16 | 1,928,810.00 | 84,134,515.54 |
| මාර්තු | 0 | 0.00 | 3693 | 82,259,384.96 | 0 | 0.00 | 21 | 2,690,893.57 | 12 | 882,851.28 | 17 | 1,654,654.00 | 87,487,783.81 |
| අප්‍රේල් | 0 | 0.00 | 3064 | 83,622,881.44 | 0 | 0.00 | 84 | 9,517,411.96 | 27 | 1,165,035.22 | 26 | 2,357,579.71 | 96,662,908.33 |
| මැයි | 0 | 0.00 | 3249 | 82,178,038.62 | 0 | 0.00 | 20 | 4,260,454.13 | 16 | 1,289,097.86 | 10 | 1,003,566.00 | 88,721,156.61 |
| ජූනි | 0 | 0.00 | 3635 | 79,980,157.49 | 0 | 0.00 | 11 | 1,943,945.49 | 13 | 546,925.39 | 14 | 1,026,013.00 | 83,497,041.37 |
| ජූලි | 0 | 0.00 | 3394 | 79,318,247.49 | 0 | 0.00 | 39 | 4,467,330.27 | 23 | 1,399,874.35 | 27 | 2,340,779.00 | 87,526,231.11 |
| අගෝස්තු | 0 | 0.00 | 3493 | 82,244,311.84 | 0 | 0.00 | 34 | 4,754,065.83 | 12 | 431,375.51 | 19 | 1,758,100.00 | 89,187,853.18 |
| සැප්තැම්බර් | 0 | 0.00 | 3573 | 83,317,649.88 | 0 | 0.00 | 29 | 3,008,960.61 | 21 | 1,301,185.94 | 14 | 1,449,151.00 | 89,076,947.43 |
| ඔක්තෝම්බර් | 0 | 0.00 | 3499 | 88,085,922.36 | 0 | 0.00 | 46 | 6,634,054.62 | 15 | 1,038,208.15 | 24 | 2,160,323.00 | 97,918,503.13 |
| නොවැම්බර් | 0 | 0.00 | 3406 | 77,427,935.28 | 0 | 0.00 | 35 | 4,894,157.10 | 11 | 574,661.04 | 13 | 1,217,067.00 | 84,113,820.42 |
| දෙසැම්බර් | 0 | 0.00 | 3469 | 85,729,176.34 | 0 | 0.00 | 27 | 4,255,765.00 | 17 | 782,716.00 | 16 | 1,822,838.00 | 92,590,495.34 |
| **එකතුව** | **0** | **0.00** | **44,550** | **1,000,009,004.99** | **0** | **0.00** | **419** | **53,552,614.87** | **195** | **10,737,303.15** | **211** | **20,187,039.71** | **1,084,485,962.72** |

## මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය

**2016 අංක 01 දරණ ශ්‍රීලංගම මානව සම්පත් කළමණාකාරණ කොට්ඨාශ චක්‍රෙල්ඛය අනුව 2016 වසරේ විස්තර වාර්තාව**

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 2016 වසරේ සිය කැමැත්තේන් විශ්‍රාම ගැන්වීමේ අයදුම්පත් ලැබී ඇති සංඛ්‍යාව | 3457 |
| 2 | 2016/10/14 දින | 1086 |
| | 2016/11/04 දින | 03 |
| | 2016/11/03 දින | 1300 |
| | 2016 වසරේ සිය කැමැත්තෙන් විශ්‍රාම ගන්වා ඇති මුළු ගණන | **2389** |
| 3 | 2016 වසරේ සිය කැමැත්තෙන් විශ්‍රාම ලැන්වීමට ලබා දුන් අයදුම්පත්‍ර අතරින් ප්‍රතික්ෂේප වූ අයදුම් පත්‍ර | 68 |

මාසිකව රු. 30,000/- දීමනාවක් යටතේ හුදෙක් කොන්ත්‍රාත් පදනම මත 06 මසක කාලය සඳහා රියදුරු/කොන්දොස්තර නව පත්වීම් ලබා දීම - 2016 වර්ෂය

| අනු අංකය | බඳවාගත් දිනය | කොන්දොස්තර | රියදුරු | එකතුව |
|---|---|---|---|---|
| 1 | 2016/03/01 | 0 | 30 | 30 |
| | එකතුව | 0 | 30 | 30 |

විධායක පත්වීම් පිළිබඳ විස්තරය - 2016

| | |
|---|---|
| ස්ථිර පත්වීම් | 15 |
| ආවරණ පත්වීම් | 48 |
| උසස්වීම් | 15 |
| ආවරණ පත්වීම් ස්ථිර කිරීම | - |
| ස්ථාන මාරුවීම් | 83 |
| කොන්ත්‍රාත් පත්වීම් | 01 |
| නව බඳවා ගැනීම් | 02 |

**2015.12.31 දිනට හා 2016/12/31 දිනට ශ්‍රී ලංගම සිටින සේවක සංඛ්‍යාව**

| තනතුර | 2015/12/31 | 2016/12/31 |
|---|---|---|
| විධායක | 1,197 | 934 |
| විධායක නොවන | 8,493 | 6,546 |
| රියදුරු | 10,563 | 10,149 |
| කොන්දොස්තර | 10,532 | 10,092 |
| කාර්මික | 5,001 | 4,867 |
| පුහුණු | 71 | 52 |
| එකතුව | 35,857 | 32,640 |

| | | |
|---|---|---|
| 2015/12/31 දිනට සිටි සේවක සංඛ්‍යාව | - | 35,857 |
| සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීම් | - | (2,389) |
| විශ්‍රාම වයස එළඹීමෙන් හා වෙනත් හේතු නිසා විශ්‍රාම යාම | - | (828) |
| **2016/12/31 දිනට සේවක සංඛ්‍යාව** | **-** | **32,640** |

**2016 වර්ෂයේ නැවත රැකියා පිළිබඳ සාරාංශය**

| අනු අංකය | තනතුර | ප්‍රතිෂ්ඨාපනය |
|---|---|---|
| 1 | රියදුරු | 69 |
| 2 | කොන්දොස්තර | 5 |
| 3 | කාර්මික | 0 |
| 4 | රිය/කොන්/කාර් හැර | 8 |
| | එකතුව | 82 |

## විනය අංශය

**2016/01/01 දින සිට 2016/12/31 දින දක්වා සියළුම ප්‍රාදේශිකයන්ගෙන් විනය අංශය වෙත ලැබුණු විනය ලිපිගොනු /විනය විභාග පැවැත්වීම /අභියාචන විභාග පැවැත්වීම/ සභාපති අභියාචනා සඳහා ලැබුණු ලිපිගොනු පිලිබඳ විස්තර වාර්තාව**

| විනය නියෝග ලිපිගොනු ලැබීම | | විනය විභාග පැවැත්වීම සඳහා ලැබුණු ලිපිගෝනු ගණන | විනය විභාග පවත්වා අවසන් කරන ලද ලිපිගෝනු ගණන | විනය නියෝග ලබා දීම | | | | අභියාචනා | | සභාපති අභියාචනා | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සමාසක(වි)** | **ජො. විනය නිළධාරි** | | | **සමාසක(වි)** | **ඉතිරි** | **ජො. විනය නිළධාරි** | **ඉතිරි** | **ලැබුණු ලිපිගොනු** | **අවසන් කරන ලද** | **ලැබුනු ලිපි** | **ලබාදුන් සහන** | **සභාපති අභියාචනා ප්‍රතික්ෂේප කිරීම** |
| **252** | **4178** | **104** | **104** | **207** | **45** | **4178** | | **436** | **436** | **328** | **175** | **147** |

## තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කොට්ඨාශය

| 2016 වර්ෂයේ දී ක්‍රියාකාරකම් | |
|---|---|
| 1. | පරිගණක 200 ක් මිලදී ගැනීම. |
| 2. | මුද්‍රණ යන්ත්‍ර 100 ක් මිලදී ගැනීම. |
| 3. | UPS යන්ත්‍ර 200 ක් මිලදී ගැනීමව්‍යාපෘතිය |
| 4. | Electronic Bus Ticket Machines 2200 මිලදී ගැනීම |
| 5. | GPS ඒකක සමඟ නාමපුවරු 4400 සවිකිරීම. |
| 6. | Salary System මෘදුකාංගය ක්‍රියාවට නැංවීම |
| 7. | අදාල මෘදුකාංග සඳහා ලංගම සේවකයින් පුහුණු කිරීම. |
| 8. | දිනපතා ප්‍රධාන කාර්යාලයේ හා ශ්‍රී ලංගම ඩිපෝවන්හි ඇති වන පරිගණක හා ඒ ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම හා ඒවා නිසි ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කළමනාකරණය කිරීම. |

## සැළසුම් හා සංවර්ධන අංශය

| සැලසුම් සංවර්ධන අංශයේක්‍රියාකාරි සැලසුම | | | | |
|---|---|---|---|---|
| යෝජිත ක්‍රියාකාරකම | භෞතික ඉලක්කය | | | |
| | කාර්තුව | | | |
| | 1 | 2 | 3 | 4 |
| 2017 වර්ෂයසඳහා සංවර්ධන හා ක්‍රියාකාරි සැලැසුම් සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ ජනවාරි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ පෙබරවාරි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ මාර්තු මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ අප්‍රේල් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ මැයි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2016 වර්ෂයේ ජුනි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |

| | |
|---|---|
| 2016 වර්ෂයේ ජූලි මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2016 වර්ෂයේ අගෝස්තු මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2016 වර්ෂයේ සැප්තැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2016 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2016 වර්ෂයේ නොවැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2016 වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ප්‍රගති වාර්තා සැකසීම | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| 2017 - 2019 වර්ෂය සඳහා සංයුක්ත සැලැසුම් සැකසීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. |
| මණ්ඩලයට අදාලසියළු සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම. | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත. |
| මාසිකවලාභාලාභවාර්තා හා මුදල් ප්‍රවාහ වාර්තා සැකසීම (ප්‍රාදේශිය වැඩපොළ/ රියදුරු පුහුණුපාසල්/ සංචාරක බංගලා ඇතුළුව) | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත. |
| ප්‍රාදේශිය වැඩපොළ,රියදුරු පුහුණු පාසල්, සංචාරකබංගලාපිළිබඳ ප්‍රගති වාර්තා සැකසීම | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත. |
| විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව සැකසීම හා ඉදිරිපත් කිරිම. | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත. |
| ප්‍රවාහන අමාත්‍යංශය හා වෙනත් රාජ්‍ය ආයතන සඳහා ඉල්ලා සිටින විශේෂවාර්ථා සකසා යැවීම. | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත් කර ඇත. |

# අභ්‍යන්තර විගණන කොට්ඨාශය

## 2016 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක්

<u>මුදල් කොට්ඨාශය</u>

1. 2016 වර්ෂයේ විගණන සැලසුම හා විගණන වැඩසටහන සකස් කිරීම.
2. මුදල් සමීක්ෂණය.
3. මුදල් පොත් පරික්ෂාව.
4. වේතන අතිකාල පරික්ෂාව.
5. වේතන/උත්සව අත්තිකාරම් පරික්ෂාව.
6. කොන්දොස්තර හිඟ මුදල් පරික්ෂාව.
7. පාරිතෝෂික ගෙවීම් පරික්ෂාව.
8. දෛනික එකතු කිරීමේ ලේඛන පරික්ෂාව.
9. දේශීය මිලදී ගැනීම් පරික්ෂාව.
10. අවසාන ගිණුම් විගණනය.
11. ගිණුම් අංශයේ අනිකුත් ලේඛන පරික්ෂාව.

<u>තොග ගබඩාව</u>

1. වාර ප්‍රවේශ පත්‍ර ලේඛන පරික්ෂාව.
2. ගබඩා සමීක්ෂණය.
3. ඉන්ධන පරිභෝජන පරික්ෂාව.
4. අමතර කොටස් පරිභෝජනය පරික්ෂාව.
5. ටයර් පරිභෝජනය පරික්ෂාව.
6. දූණු කොළ පරිභෝජනය පරික්ෂාව.
7. අපහරණ කටයුතු.

<u>ධාවන කොට්ඨාශය</u>

1. මාර්ග ලේඛන පරික්ෂාව.
2. අනතුරු ලේඛන පරික්ෂාව.
3. කාර්ය වක්‍ර ලේඛන පරික්ෂාව.
4. ධා/51, ධා/50, ධා/40, ධා/41 ලේඛන පරික්ෂාව.

<u>ඉංජිනේරු කොට්ඨාශය</u>

1. ආපදා අළුත්වැඩියාව.
2. අමතර කොටස් අධික පරිභෝජනය.
3. අකාලයේ අසාර්ථක වන අමතර කොටස් පරික්ෂාව.
4. ඉංජිනේරු අංශයේ අනිකුත් ලේඛන පරික්ෂාව.

**<u>වෙනත්</u>**

1. විනය ලේඛන පරික්ෂාව.
2. නිවාඩු ලේඛන පරික්ෂාව.
3. මණ්ඩලීය වත්කම් පරික්ෂාව.
4. රියදුරු අභ්‍යාස විද්‍යාල වල ආදායම්, වියදම්, නඩත්තු හා පාලන යන අංශ විගණනයට ලක් කිරීම.
5. සංචාරක නිවාඩු නිකේතන පරික්ෂාව.
6. ශාලිකා ශාලාව හා ක්‍රීඩාංගනය පරික්ෂාව.
7. ප්‍රධාන කාර්යාලයේ පොදු කාර්ය වියදම් විශ්ලේෂණය. (ජලය, දුරකථන, විදුලිය, ලිපිද්‍රව්‍ය)
8. රාජ්‍ය ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති.
9. ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරික්ෂකවරුන්ගේ මාසික සාකච්ඡා පැවැත්වීම.
10. ත්‍රෛයිමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම.
11. සභාපතිතුමා විසින් යොමු කරන විශේෂ පරීක්ෂණ.
12. ප්‍රාදේශීය ඒකක වල වාර්ෂික විගණන සාකච්ඡා පැවැත්වීම.

## සම්පාදක කොට්ඨාශය

| අනු අංකය | විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතියේ නම | 2016 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල (රු. මිලියන) | මූල්‍ය ප්‍රගතිය | නිමවුම් ඉලක්කය | භෞතික ප්‍රගතිය 2016.12.31 දිනට |
|---|---|---|---|---|---|---|
| 01 | සියළු මිලදී ගැනීම් සහ විකිණීම සිදු කිරීම. | මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම. | 650.00 | | සුඛෝපභෝගී බස්රථ 50 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | මූල්‍ය පහසුකම් නොමැති බැවින්, මිලදීගෙන නොමැත. |
| 02 | සියළු මිලදී ගැනීම් සහ විකිණීම සිදු කිරීම. | මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම. | 54.00 | | මෝටර් වෑන් 09ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2016.11.03 වන දින ටෙන්ඩරය ප්‍රධාන කිරීමේ ලිපිය නිකුත් කර ඇත. හැටන් ඩිපෝව සහ අනුරාධපුර ප්‍රාදේශිකය සඳහා වාහන දෙකක් ඇණවුම් කර අදාල චෙක්පත්ද එවා ඇත. |
| | | | 6.00 | | මෝටර් කාර් 02 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | ශ්‍රී ලංගම පිරිවිතරයන්ට අනුකූලව නොවූ බැවින් අනුමත කර නොමැත. |
| | | | 10.83 | 10.83 | ත්‍රීවීල් 19 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම. | 2016.07.08 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. 2016.07.22 ත්‍රීවීල් 19 ලැබී ඇත. |
| | | | 0.40 | 0.342 | මෝටර් බයිසිකල් 02 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2016.07.08 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. පොතුහැර, කළුතර සහ බදුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාල සඳහා යතුරුපැදි 03 ක් ලබාගෙන ඇත. |
| 03 | | | 13,292.07 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඩීසල් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | වෙළෙඳපොළ මිල ගණන් අනුව ඩිපෝ මට්ටමින් තම අවශ්‍යතාවයන් මිලදී ගැනීම සිදු කරයි. |
| 04 | | | | | බස්රථ නඩත්තුව/ අළුත්වැඩියාව සහ කට්ටල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමට කටයුතු සිදු කිරීම. | අමතර කොටස් අවශ්‍යතාවයන් පාලන ගිණුම් අනුව වර්ගීකරණය කර ඒවායේ මූල්‍ය සීමාව යටතේ ටෙන්ඩර් කටයුතු සිදුකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙතින් සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත මිලදී ගැනීම් සිදුකරනු ලබයි. අනුමත මිල ගණන් අනුව ප්‍රාදේශිකයන් හා ඩිපෝවන් විසින් පිළිවෙත් ප්‍රකාරව මිලදී ගැනීම සිදු කරයි. |
| | | | 757.40 | 228.04 | I. සාමාන්‍ය බස්රථ සඳහා | |
| | | | 32.47 | | II.යුටෝන්බස්රථ සඳහා | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | | | 26.27 | 01.20 | බස්රථ නඩත්තුව/ අළුත්වැඩියාව සඳහා තීන්ත මිලදී ගැනීම සිදුකර ඇත. | ශ්‍රී ලංගම ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඩිපෝ සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගෙන ඇත. |
| 06 | | | | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය නව ටයර් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2016.05.06 වන දින ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත නව ටයර් මිලදී ගැනීම සිදු කරනු ලබයි. |
| | | | 1,146.91 | 567.55 | I. සාමාන්‍ය බස්රථ සඳහා | |
| | | | 24.49 | 11.10 | II.යූටෝන් බස්රථ සඳහා | |
| 07 | | | 111.90 | 80.62 | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය නව බැටරි මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2016.05.06 වන දින ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. ශ්‍රී ලංගම ප්‍රසම්පාදන මගින් පත්කරන ලද කමිටුවේ අනුමැතිය මත නව බැටරි මිලදීගැනීම සිදුකරනු ලබයි. |
| 08 | | | 1,100.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය නව එන්ජින් කට්ටල් මිලදීගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br><br>I. ලේලන්ඩ් එන්ජින් කිට් 326<br>II. ටාටා එන්ජින් කිට් 174 | 2016.06.22 වන දින අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව යටතේ නව එන්ජින් කට්ටල් 326 ලබාගැනීම සඳහා කටයුතු සිදුකර ඇත.<br><br>තවද, 2016.11.15 වන දින එන්ජින් කට්ටල් 163 ක් ලබාගැනීමට ඇනවුම් කර ඇත. |
| 09 | | | 645.60 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය එන්ජින්/ ගියර් බොක්ස් වැනි කට්ටල් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. ප්‍රාදේශික අනුව ඩිපෝ මට්ටමින් සිදුකර ගන්නා ලද අළුත්වැඩියාවන් සඳහා වැය කරන ලද වියදම මුදල් අංශයෙන් ලබාගත යුතුය. |
| 10 | | | 58.56 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය දුණුකොළ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2016.10.18 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත අවශ්‍යතාව අනුව ප්‍රාදේශික මට්ටමින් මිලදී ගැනීමට උපදෙස් ලබාදී ඇත. ඩිපෝ මට්ටමින් ලබාගන්නා ලද දුණුකොළ වල වියදම මුදල් කොට්ඨාශයෙන් ලබාගත යුතුය. |
| 11 | | | 398.88 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ග්‍රීස් සහ ඔයිල් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | වෙළඳපොළ මිල ගණන් අනුව ඩිපෝ මට්ටමින් තම අවශ්‍යතාවයන් මිලදී ගැනීම සිදු කරයි. වැය වූ මුදල්, මුදල් කොට්ඨාශයෙන් ලබාගත යුතුය. |
| 12 | | | 1,127.18 | 338.47 | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ටයර් පිරවීම සහ පෙර සවිකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම. | අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව මගින් 2016.05.17 වන දින ටෙන්ඩරය ප්‍රධානය කර ඇත. ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත අවශ්‍යතාව අනුව ප්‍රාදේශික මට්ටමින් ලබාගන්නා ලද පෙරසවි සහ නැවත පිරවූ ටයර් වල මිල ගණන් මුදල් කොට්ඨාශයෙන් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ලබාගත යුතුය. |
| 13 | | | 65.20 | 44.75 | බස්රථ ධාවනයට අවශ්‍ය නව ටිකට් මැෂින් මිලදීගෙන අවශ්‍ය පරිදි ලබා දීම | 2016.08.11 වන දින ටිකට් යන්ත්‍ර 2500 ක් මිලදී ගැනීමට ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. 2016.10.05 වන දින එම ටිකට් යන්ත්‍ර 2500 ලැබී ඇත. |
| 14 | | | 82.76 | 06.36 | අවශ්‍ය පරිදි ටිකට් රෝල් සහ ටිකට් පොත් මිලදීගැනීම | 2016.07.08 වන දින දෙපාර්තමේන්තු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ටෙන්ඩරය ප්‍රදාන කර ඇති අතර ටෙන්ඩර් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත 2016.01.06 වන දින ටිකට් පොත් සඳහා ද ටෙන්ඩරය ප්‍රදාන කර ඇත. ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත අවශ්‍යතාව අනුව ප්‍රාදේශික මට්ටමින් මිලදී ගැනීමට උපදෙස් ලබාදී ඇත. |
| 15 | | | 4.45 | 02.83 | අවශ්‍ය පරිදි වාර ප්‍රවේශපත්‍ර මුද්‍රණ කර සැපයීම. | 2016.12.31 වෙනි දිනට වාර ප්‍රවේශපත්‍ර 4552000 මුද්‍රණය කර ලැබී ඇත. |
| 16 | | | 0.54 | | ශ්‍රී ලංගම මෙහෙයුම්/ පාලන කටයුතු සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ ලිපිද්‍රව්‍ය මිලදී ගෙන සැපයීම. | අවශ්‍යතාවය පරිදි දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| 17 | | | 465.81 | | ශ්‍රී ලංගම ගොඩනැගිලි සහ අංගන වල නඩත්තු සහ නව ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගෙන සැපයීම | අවශ්‍යතාවය පරිදි නඩත්තු කටයුතු සිදු කිරීමට හා භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. එම විස්තර මුදල් කොට්ඨාශයෙන් ලබාගත යුතුය. |
| 18 | | | 80.02 | | ශ්‍රී ලංගම ගොඩනැගිලි සහ අංගන වල විදුලි නඩත්තු සහ නව ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන සැපයීම. | අවශ්‍යතාවය පරිදි විදුලි නඩත්තුව සිදු කිරීමට හා භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. එම විස්තර මුදල් කොට්ඨාශයෙන් ලබාගත යුතුය. |
| 19 | | | 6.61 | 03.85 | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ මිලදී ගෙන සැපයීම. | අවශ්‍යතාවය පරිදි දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 20 | | | 16.33 | 10.58 | අවශ්‍ය පරිදි කොම්පියුටර් 75/ ප්‍රින්ටර් 75/ යූපීඑස් 75/ මිලදීගෙන සැපයීම. | 2016.10.18 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ටෙන්ඩරය ප්‍රදාන කර ඇත. එයින් කොම්පියුටර් 50ක් 2016.12.15 සහ 25ක් 2016.12.27 ද, ප්‍රින්ටර් 50 ක් 2016.11.01 සහ 25 ක් 2017.01.17 ද, යූපීඑස් 2016.11.04 සහ 25ක් 2016.12.22 ලැබී ඇත. |
| 21 | | | 5.51 | | අවශ්‍ය පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙගන සැපයීම. | අවශ්‍යතාවය පරිදි දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය මත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. අවශ්‍යතාව පරිදි ඩිපෝ මට්ටමින් මිලදීගැනීම සිදු කර ඇත. අදාල විස්තර මුදල් අංශයෙන් ලබාගත යුතුය. |
| 22 | | | | 6.50 | අබලි බස්රථ සහ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය ඇතුළුව අභාවිත අමතර කොටස් ටෙන්ඩර් මගින් සහ ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් විකිණීමට කටයුතු සිදුකිරීම. | 2016 වර්ෂයේ අබලි බස්රථ වෙන්දේසි කර නොමැත. තවද, 2016.12.31 දිනට අබලි ද්‍රව්‍ය විකුණා රු. 6,507,991.20 ක ආදායමක් ලබාගෙන ඇත. |

## 2016/01/01 සිට ටෙන්ඩර් මණ්ඩලය මගින් පහත සදහන් ක්‍රියාකාරකම් වලට කැදවූ මිල ගණන් වල සාරාංශය

| අනු අංකය | දිනය | කරන ලද කාර්යයන් | ටෙන්ඩරය විවෘත කළ දිනය |
|---|---|---|---|
| 01 | 2016.01.08 | ශ්‍රී ලංගම රියදුරු අභ්‍යාස විද්‍යාල සඳහා අවශ්‍ය නව වාහන මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවීම. | 2016.01.28 |
| 02 | 2016.01.13 | Supply & Intallation of 3000 Gallon Storage Tank At SLTB-Rathmalana Depot | 2016.02.02 |
| 03 | 2016.01.21 | ශ්‍රී ලංගම ලිපි ශීර්ෂ (Letter Heads) මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | 2016.02.12 |
| 04 | 2016.01.22 | Quotation for the supply of Electric Geezer for Circuit Bangalow (I) at Nuwara Eliya (SLTB) | 2016.02.03 |
| 05 | 2016.01.25 | Quotation for the supply of Identity Card Printing Raw Materials For - SLTB | 2016.02.16 |
| 06 | 2016.01.26 | Quotation for Stationery Items for SLTB Head Office. | 2016.02.16 |
| 07 | 2016.02.01 | Quotation for Toners, Cartridges & Ink Ribbons for SLTB Head Office. | 2016.02.18 |
| 08 | 2016.02.02 | Construction AluminumSuspended Ceiling for Inquiry - Office at S'L.T.B. - Head Office | 2016.02.19 |
| 09 | 2016.02.09 | Quotation for the Procurement Of 10 Nos Crank Shaft with Bearing To SLTB | 2016.02.24 |
| 10 | 2016.02.12 | Supply & Installation of 3000 Gallon Storage Tank At SLTB-Rathmalana Depot | 2016.02.29 |
| 11 | 2016.02.12 | ශ්‍රී ලංගම ශාලිකා ක්‍රීඩාංගනය සඳහා ශීතකරණයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | 2016.02.26 |
| 12 | 2016.02.18 | ශ්‍රී ලංගම අම්පාර ටයර් කම්හලේ බෆින් කුඩු (Buffine Powder) විකිණීම සඳහා මිල ගණන් කැඳවීම. | 2016.03.02 |
| 13 | 2016.02.19 | Quotation for the Supply of Identity Card Printing Raw Materials For - SLTB | 2016.03.03 |
| 14 | 2016.02.26 | Quotation for The Electrical Items at SLTBHead Office-2016 | 2016.03.15 |
| 15 | 2016.03.04 | Repairing of Roof of The Enging Store Room At Yatinuwara Work Shop | 2016.03.24 |
| 16 | 2016.03.04 | Repairing of Bank of Ceylon BuildingBlock At Central Bus Stand- Pettah | 2016.03.24 |
| 17 | 2016.03.16 | ශ්‍රී ලංගම ලිපි ශීර්ෂ (Letter Heads) මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම. | 2016.03.23 |

| | | | |
|---|---|---|---|
| 18 | 2016.03.16 | ශ්‍රී ලංගම මල්ලාකම් ප්‍රාදේශීය වැඩපොළ සඳහා ඉන්ජෙක්ටර් පොම්ප ටෙස්ට් බෙන්ච් එකක් මිලදී ගැනීම. | 2016.04.07 |
| 19 | 2016.03.24 | භික්ෂු කූපන් ටිකට් පොත් මුද්‍රණය කිරීම සඳහා මිලගණන් කැඳවීම. | 2016.04.08 |
| 20 | 2016.03.25 | Quotation for the Purchase of New Wireless Access Point to SLTB Head Office | 2016.04.08 |
| 21 | 2016.03.25 | Supplying Making Fixing Aluminium Windows IN C.E.O.Office AT S.L.T.B.Head Office | 2016.04.19 |
| 22 | 2016.03.30 | Quotation For Renovation of Conference Hall in Training School At Pothuhera. | 2016.03.30 |
| 23 | 2016.03.31 | මහනුවර ප්‍රාදේශිකයට අයත් මාතලේ/ වත්තේගම/ තෙල්දෙණිය/ උඩුදුම්බර හා යටිනුවර ඩිපෝවල ධාවනයෙන් ඉවත් කරන ලද අබලි බස්රථ ටෙන්ඩරය. | 2016.05.03 |
| 24 | | | |
| 25 | 2016.04.05 | ශ්‍රී ලංගම 2016 වර්ෂය සඳහා නව ටයර් කිට් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම. | 2016.04.07 |
| 26 | 2016.04.06 | Procurement OfNew Batteries For Year- 2016 | 2016.04.29 |
| 27 | 2016.04.07 | ශ්‍රී ලංගම නිල වාහන අළුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම | 2016.04.20 |
| 28 | 2016.04.07 | Quotation For The Procurement Of 60 Nos Crank Shaft With Bearing To SLTB | 2016.04.27 |
| 29 | 2016.04.19 | ශ්‍රී ලංගම සඳහා ජෙනරේටර් මිලදී ගැනීම. | 2016.05.04 |
| 30 | 2016.04.27 | SUPPLYING MAKING AND FIXING OF PATITION AND DOORS IN LEGAL DIVISION AT SLTB - HEAD OFFICE | 2016.05.16 |
|---|---|---|---|
| 401-2-A | බස් රථ සඳහා තෙල් හා ලිහිසි (සෘජු පිර | 358,237,115.93 | 363,545,839.38 |
| 401-2-B | ඉන්ධන බස් රථ සඳහා (සෘජු පිරිවැය) | 12,494,589,811.14 | 12,387,976,442.32 |
| | **එකතුව** | **12,852,826,927.07** | **12,751,522,281.70** |

## වෙනත් සෘජු විචල්‍ය පිරිවැය

| | | | |
|---|---|---|---|
| 401-3-1 | අමතර කොටස් | 1,544,950,797.69 | 1,171,298,435.80 |
| 401-3-2 | නව ටයර් හා ටියුබ් | 775,655,613.29 | 761,465,475.04 |
| 401-3-3 | නැවත පිරවූ ටයර් | 1,314,823,782.30 | 1,143,124,060.39 |
| 401-3-4 | බස්රථ සඳහා බැටරි | 108,142,756.06 | 68,854,077.16 |
| 401-3-5 | බස් රථ සඳහා අළුත් වැඩියා හා නඩත්‍ | 118,567,722.19 | 144,483,241.04 |
| 401-3-6 | බස් රථ රක්ෂණ වියදම් | 32,987,518.02 | 50,403,671.43 |
| 401-3-7 | බස් රථ ලියාපදිංචි ගාස්තු | 7,147,589.43 | 7,703,281.58 |
| 401-3-8 | ටිකට් හා මාර්ග ලේඛන ගාස්තු | 63,582,536.21 | 54,437,761.95 |
| | **එකතුව** | **3,965,858,315.19** | **3,401,770,004.39** |

## 17. වෙනත් මෙහෙයුම් ආදායම

| ගිණුම් සංකේත | විස්තරය | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|---|
| 303-1 | කුලී ආදායම | 17,307,070.85 | 5,834,180.00 |
| 303-2 | රියදුරු අභ්‍යාස විද්‍යාල | (33,017,651.63) | 47,088,541.43 |
| 303-3 | ඉන්ධන පිරවුම්හල දළ ලාභය | 22,123,738.99 | 33,916,173.34 |
| 303-4 | සංචාරක බංගලා | 15,941,499.00 | 885,550.00 |
| 303-5 | ප්‍රචාරණය | 32,276,437.16 | 9,756,945.00 |
| 303-6 | දඩ වියදම් | 4,842,242.57 | 2,793,955.65 |
| 303-8 | පොලී ආදායම | - | 50,630.65 |
| 303-9 | දැවි තෙල් විකුණුම් | 17,926,629.30 | 22,051,868.16 |
| 303-10 | මුදල් අධිකය | 2,725,452.37 | 5,397,505.02 |
| 303-11 | අලාභ අයකර ගැනීම් | 31,032,635.56 | 25,193,779.61 |
| 303-12 | දේපල වලින් ලැබු ආදායම | 350,351.79 | 4,522,677.67 |
| 303-13 | ගොඩනැගිලි හා ආපන ශාලා කුලී | 2,214,204.33 | 7,079,660.61 |
| 303-14 | කොමිස් හා වට්ටම් | 84,702,561.42 | 77,152,632.66 |
| 303-15 | යෝග්‍යතා සහතික | 9,184,476.91 | 7,743,080.00 |
| 303-16 | පිට අළුත් වැඩියා වලින් ලැබු ආදායම | 292,558.40 | 1,024,149.00 |
| 303-17 | දොඹකර ගාස්තු | 514,376.22 | 822,177.50 |
| 303-18 | රක්ෂණ කොමිස් | 1,435,591.44 | 581,143.33 |
| 303-19 | අයකැමි අධිකය | 402,140.13 | 430,130.64 |
| 303-20 | හැඳුනුම්පත් වලින් ලැබු ආදායම | 3,909,547.74 | 3,147,734.87 |
| 303-21 | තොග ගැළපුම් ගිණුම | (16,602,531.89) | 120,428,954.91 |
| 303-22 | අතිරික්තය/හිඟය ඉන්ධන තොගය | 46,673,819.57 | 42,471,837.27 |
| 303-23 | අබලි ද්‍රව්‍ය විකුණුම් | 6,308,741.50 | 6,532,289.45 |
| 303-24 | මිශ්‍ර ආදායම් | 204,672,763.87 | 166,045,104.21 |
| 303-25 | ශාලිකා ආදායම් | 3,051,750.00 | 5,120,525.00 |
| 303-26 | ඉන්ධන ආදායම් | 13,762,091.22 | 13,804,101.82 |
| 303-27 | බස්රථ විකුණුම් ලාභය | 30,681,281.80 | 60,473,109.38 |
| 303-29 | වෙනත් අයතම විකුණුම් | 376,808.00 | 95,167.50 |
| 303-30 | අබලි ද්‍රව්‍ය අතිරික්තය | 132,590.64 | 56,790.70 |
| 303-31 | අධි අඩමානණය | 5,312,180.97 | - |
| 302-1-4 | වෙනත් ප්‍රතිපාදන | 12,629,204,153.81 | 1,090,605,904.42 |
| 302-1-A | වේතන ප්‍රතිපාදන | - | 10,855,904,479.00 |
| 302-3-C | සේවක අර්ථසාධක ප්‍රතිපාදාන | 11,760,858.00 | 370,000,000.00 |
| | **එකතුව** | **13,149,498,370.04** | **12,987,010,778.80** |

## 18. ආයතන හා පරිපාලන වියදම්

| ගිණුම් සංකේත | විස්තරය | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|---|
| | වැටුප් හා වේතන | 1,551,884,551.33 | 1,611,860,665.31 |
| | අතිකාල හා නිවාඩු දීමනා | 236,944,980.50 | 203,411,211.17 |
| | ජීවනාංක දීමනාව | 743,128,730.07 | 800,548,187.10 |
| | ගමන් වියදම් දීමනා | 59,260,885.47 | 35,446,730.27 |
| | වෙනත් විශේෂ දීමනා | 1,156,946,211.55 | 1,176,905,379.20 |
| | අළුත්වැඩියා හා නඩත්තු | 144,410,669.43 | 120,477,970.74 |
| 402-1-6 | සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 2,313,227.16 | 2,245,795.05 |
| 402-1-8 | පෞද්ගලික හා ආරක්ෂක වේතන | 28,138,666.06 | 47,796,492.97 |
| 402-1-9 | වෛද්‍ය බිල්පත් | 1,627,667.89 | 1,954,664.84 |
| 402-1-10 | වෙනත් දීමනා | 112,982,622.30 | 75,367,125.17 |
| 402-1-11 | කොන්ත්‍රාත් හා දෛනික සේවක දීමනා | 28,414,138.03 | 38,254,466.40 |
| 402-1-12 | සේවක අර්ථසාධක අරමුදල් | 391,684,602.37 | 407,173,570.66 |
| 402-1-13 | සේවක භාරකාර අරමුදල් | 87,616,695.50 | 103,507,461.45 |
| 402-2-5 | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 79,743,050.69 | 79,970,106.88 |
| 402-2-6 | කුලී හා නඩත්තු | 27,522,688.83 | 30,702,341.34 |
| 402-2-7 | දුරකථන | 33,998,882.84 | 33,831,537.25 |
| 402-2-8 | විදුලිය | 108,494,965.77 | 120,851,557.83 |
| 402-2-9 | ජල ගාස්තුව | 31,165,207.86 | 31,271,797.98 |
| 402-2-10 | වාර්ෂික ප්‍රසාද දීමනා | 68,734,742.82 | 45,963,311.19 |
| 402-2-11 | පාරිතෝෂික දීමනා | 1,144,831,511.75 | 1,280,048,333.50 |
| 402-2-12 | වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම | 13,552,184.33 | 5,434,197.63 |
| 402-2-13 | නීති වියදම් | 29,351,864.64 | 38,606,698.51 |
| 402-2-14 | සුභසාධන වියදම් | 20,712,861.89 | 13,309,807.27 |
| 402-2-15 | මියගිය සේවකයන්ට ගෙවන අනුකම්පා | 34,217,124.38 | 15,895,739.81 |
| 402-2-16 | සේවක වන්දි | 2,295,138,353.70 | 7,169,413.15 |
| 402-2-17 | පොලිස් ආරක්ෂක වියදම් | 31,044.00 | 44,282.00 |
| 402-2-19 | ඉන්ධන තෙල් හා ලිහිසි (වක්‍ර වියදම්) | 28,461,440.75 | 34,740,013.30 |
| 402-2-20 | සංග්‍රහ වියදම් | 12,644,239.00 | 8,211,119.71 |
| 402-2-21 | වෙනත් වියදම් | 1,805,969,683.16 | 691,103,971.27 |
| 402-2-22 | බොල්ණය වෙන් කිරීම් | 1,250.00 | 775,797.99 |
| 402-2-23 | ප්‍රචාරණ වියදම | 4,440,742.45 | 3,776,136.94 |
| 402-2-24 | වෙනත් වාහන සඳහා රක්ෂණ | 5,312,596.32 | 5,670,046.95 |
| 402-3-2 | ක්ෂය | 38,202,735.84 | 38,883,029.44 |
| | **එකතුව** | **10,327,880,818.69** | **7,111,208,960.27** |

## 19. මූල්‍ය හා වෙනත් වියදම්

| ගිණුම් සංකේත | විස්තරය | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|---|
| 402-4-1 | අයිරා පොලිය | 58,745,338.60 | 77,365,913.50 |
| 402-4-2 | බැංකු ගාස්තු | 23,212,593.94 | 21,901,426.12 |
| 402-4-3 | හර බදු | 204,315.46 | 569,800.68 |
| 402-4-4 | කල්බදු පොලී ගිණුම | 323,399,174.65 | 427,439,683.16 |
| 402-4-5 | වෙනත් මූල්‍ය වියදම් | 314,682,140.85 | 61,320,114.77 |
| | **එකතුව** | **720,243,563.50** | **588,596,938.23** |

| ගිණුම් සංකේත | විස්තරය | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|---|
| 303-7 | තැන්පතු පොලී ආදායම | 56,663,229.15 | 50,775,874.91 |
| | මුලු මූල්‍ය වියදම | **56,663,229.15** | **50,775,874.91** |

| | | | |
|---|---|---|---|
| | **ශුද්ධ මූල්‍ය වියදම** | **663,580,334.35** | **537,821,063.32** |

## 20.නිෂ්පාදන අලාභය

| | | 2016.12.31 | රු. | 2015.12.31 | රු. |
|---|---|---|---|---|---|
| 403-1 | 2016.01.01 දිනට නොනිමි වැඩ | 36,459,327.27 | | 3,736,604.60 | |
| | **එකතු කලා** | | | | |
| 403-2 | අමුද්‍රව්‍ය මිලදී ගැණුම් | 213,727,739.58 | | 277,011,800.33 | |
| | **අඩු කලා** | | 250,187,066.85 | | 280,748,404.93 |
| 403-4 | භාණ්ඩ ආපසු යැවුම් | 850,042.63 | | 641,543.12 | |
| | 2015.12.31 දිනට නොනිමි වැඩ | 4,618,687.74 | | 36,459,327.27 | |
| | | | 5,468,730.37 | | 37,100,870.39 |
| | නිමි භාණ්ඩ වල මූලික පිරිවැය | | 244,718,336.48 | | 243,647,534.54 |
| | **කම්හල් පොදු කාර්ය පිරිවැය** | | | | |
| 403-1-A | කම්හල් වැටුප් හා දීමනා | 206,628,034.54 | | 201,244,076.03 | |
| 403-1-B | අතිකාල | 6,021,034.21 | | 5,207,997.67 | |
| 403-1-C | ගමන් වියදම් දීමනා | 297,609.18 | | 322,354.50 | |
| 403-1-D | සේවක අර්ථසාධක අරමුදල | 17,077,870.06 | | 20,746,849.99 | |
| 403-1-E | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුද | 4,148,166.28 | | 5,087,142.53 | |
| 403-1-F | වෙනත් වියදම් | 4,762,627.35 | | 5,511,683.84 | |
| | කම්හල් පිරිවැය | | 238,935,341.62 | | 238,120,104.56 |
| | **මුළු නිෂ්පාදන පිරිවැය** | | 483,653,678.10 | | 481,767,639.10 |
| 403-3 | නිෂ්පාදන ආදායම | | 354,538,224.55 | | 306,767,300.32 |
| | **නිෂ්පාදන හිඟය** | | **129,115,453.55** | | **175,000,338.78** |

## 21. රජයේ ප්‍රතිපාදන

| ගිණුම් සංකේත | විස්තරය | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|---|
| 302-2-B | ප්‍රතිසංස්කරණ ප්‍රතිදාන | 1,008,832,914.86 | 907,376,605.86 |
| 302-5-E | බස්රථ සඳහා රජයේ ප්‍රතිදාන | 634,932,777.18 | 393,492,705.81 |
| | **එකතුව** | **1,643,765,692.04** | **1,300,869,311.67** |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීවීඩී/ඊ/ශ්‍රීලංගම/මූල්‍ය/01/2016/28 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 14 දින


සභාපති,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවහනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි නිර්ණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාවහනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස හීනතාවයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු.20,851,282,909 ක සෘණ අගයක් ගෙන තිබූ අතර, ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අවිනිශ්චිතතාවයන් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය තත්ත්වය විග්‍රහ කිරීමේදී 2011 සිට 2015 දක්වා කාලය තුළ ජංගම වගකීම් ආවරණය කරගැනීම සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණය මුළු ජංගම වගකීම්වලින් සාමාන්‍ය සියයට 32 ක පහළ මට්ටමක පැවති අතර 2016 වර්ෂයේදී එම මට්ටම සියයට 49 ක් ලෙස පැවතුණි. ගෙවියයුතු මුදල් නියමිත පරිදි නොගෙවීම, අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලීනව නිරවුල් නොවී ඉදිරියට එමින් පවතින ශේෂ මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන භාවිතයට ගනු ලබන රු. 81,415,892ක් වටිනා වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) මණ්ඩලයේ බස්රථ ඇණියෙන් සමාලෝචිත වර්ෂය වන විට රු.1,367,754,792 ක් බස් රථ ගර්හිත කර තිබුණු අතර, එම බස්රථවල ක්ෂය වටිනාකම රු. 1,370,972,541ක් වී තිබුණි. මෙම බස් රථ භාවිතයෙන් ඉවත් කර තිබුණද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. ගර්හිත බස්වල පිරිවැය ඉක්මවා රු.3,217,749 ක් ක්ෂය අවලංකිරීම් සිදුකර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී රු.1,041,195 ක් වටිනා වාහන ගර්හිත කර තිබුණද, එම ගර්හිත වාහන වෙනුවෙන් රු.520,385 ක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබූ අතර එම වාහන ඉවත් කිරීමට කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(iv) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වුවද ප්‍රමිතයට පටහැනි ලෙස රු.319,799,318 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකමින් සියයට 50 ක් ගොඩනැගිලි වටිනාකම ලෙස උපකල්පනය කර, සියයට 2.5 බැගින් ක්ෂය ගණනය කර තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිලිවල පිරිවැය ඉක්මවා රු. 1,005,499 ක් ක්ෂය කර තිබුණි.

## (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17

--------------------------------

(i) ප්‍රමිතයේ 31 (ආ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වගකීම් දැක්වීමේදී එම කල්බදු වත්කම්වල සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය දැක්විය යුතු වුවද, මණ්ඩලය විසින් කල්බදු වගකීම පිරිවැය මතද, පොලී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය(Sum of digit method) මතද ගණනය කර රු.7,383,195,074 ක් ලෙස කල්බදු වගකීම් යටතේ දක්වා තිබුණි.

(ii) කල්බදු සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

- කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීමක්.
- වසරකට නොඅඩු කාලයකට, වසරකට වැඩි සහ වසර 05 කට අඩු සහ වසර 05 කට වැඩි කාලපරිච්ඡේදයන්ට අදාළව ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19

---

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව අර්ථ දක්වන ලද පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීමේදී ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කළ යුතු වුවත් ඊට පටහැනි ලෙස එක් එක් ශ්‍රේණියේ මධ්‍යන වැටුපට ජීවන වියදම් දීමනාව හා අතිරේක දීමනා එකතු කර නිලධාරීන් ගණනින් වැඩි කිරීම මගින් මුළු පාරිතෝෂික දීමනා වෙන්කිරීම ගණනය කර තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

ආයතනය විසින් පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර 2015 වර්ෂයේ මිලට ගෙන තිබුණු රු. 9,510,486 ක් වටිනා මෘදුකාංග සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,377,621 ක් වූ ක්‍රමක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ කාර්යාලයෙහි, කඩ කුලී ආදායම විදුලිය හා ජලබිල්පත් ගාස්තු මුදල් පදනම මත ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.3,199,955 ක හිඟ කඩකුලී ආදායම හා රු.773,967 ක් වූ හිඟ විදුලිය හා ජල බිල්පත් ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.147,965ක් වූ බැංකු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලීය ගබඩා සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු. 1,107,267 ක් වූ මගී ටිකට් පොත්, ජෙනරේටර් ප්‍රවැයි කූපන්පත් ඇතුළුව ගබඩා අයිතම 11 ක්, පාවිච්චියට ගත නොහැකි වූ අතර එහි එම වටිනාකම තොගයෙන් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් තොග අගය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් උඩුගම ඩිපෝවට අදාළව බැංකු ජංගම ගිණුම් වෙත සෘජුව ලැබී තිබුණු සිසු සැරිය හා නිසි සැරිය ආදායම් පිළිවෙලින් රු. 378,072 ක් හා රු. 793,164ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) හොරොව්පතාන නව ඩිපෝවේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රු.32,436,777 ක් වැය කර තිබූ අතර එය 2012 ජුනි 11 දින සිට භාවිතයට ගෙන තිබියදී එම වැය කරන ලද මුදල් තවදුරටත් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි ක්ෂය වටිනාකම්ද රු.810,919 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.2.5 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.390,910 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ක්‍රියාකාරී නොවන ගිණුම් | | |
| | - හර | 9,935,459,128 | කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි. |
| | - බැර | 26,054,954,882 | |
| (ii) | ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු. | 6,905,000 | තැන්පත් සහතික. |
| (iii) | මුදල් ශේෂය. | 1,856,558,905 | ඩිපෝ වශයෙන් වෙන්කළ විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන |
| (iv) | බැංකු ඉයිරා | 889,251,471 | |
| (v) | වෙළඳ ණය හිමියෝ | 2,434,887,483 | |
| (vi) | අනෙකුත් ණය හිමියෝ | 137,398,234 | |
| (vii) | කැෂියර් හිඟ ශේෂය | 34,776,498 | |
| (viii) | කොන්දොස්තර අක්‍රමිකතා ශේෂය | 11,595,695 | |

| | | | |
|---|---|---|---|
| (ix) | විවිධ ණය ගැති | 101,155,750 | |
| (x) | ලැබිය යුතු ආදායම් | 233,785,840 | විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේෂණ හා ශේෂ සනාථන |
| (xi) | වෙළඳ ණය ගැති ශේෂය | 19,632,110 | උපලේඛන |
| (xii) | ඉතිරි කිරීමේ ගිණුම් | 31,297,381 | ගිණුම් 11 ක් සඳහා ශේෂ සනාථ ලිපි |
| (xiii) | ඉඩම් ගොඩනැගිලි | 319,799,318 | වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛනය හා තක්සේරු වාර්තා |
| (xiv) | තොග | 817,776,589 | විස්තරාත්මක තොග වාර්තා |
| (xv) | අවලංගු කල චෙක්පත් | 7,138,279 | |
| (xvi) | තෙවැනි පාර්ශව සඳහා ගෙවීම් (වැටුප් අවකරණ) | 49,013,863 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |

## 2.2.7 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් දායක මුදල හා අධිභාර මුදල රු.3,720,781,715 ක් වුවද සේවක අර්ථසාධක අරමුදල අනුව අයවිය යුතු ශේෂය රු.5,343,474,711 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ශේෂය රු. 1,622,692,996 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ කාර්යාලයෙහි හිඟ කඩකුලී ආදායම් ලෙස 2009 වර්ෂයේ සිට රු. 1,863,414 ක් ද 2014 වර්ෂයේ සිට රු.5,368,009 ක මුදලක්ද අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ අයවිය යුතු බලපත්‍ර ආදායම් රු. 142,466,102 ක් වූ අතර ඉන් රු. 12,783,486 ක් වසරකට වැඩි වී තිබුණි. මණ්ඩලය මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මිලදී ගැණුම් අත්තිකාරම් ගිණුමෙහි නොපියවූ ශේෂ එකතුව රු.1,635,847,558 කින් රු. 1,633,859,392 ක් හෙවත් සියයට 99 ක් වසර 01 සිට වසර 03ක කාල පරාසයක් තුල ලබා දී නොපියවූ අත්තිකාරම් වන අතර සියයට 40 ක් එනම් රු. 649,682,474 ක් වසර 3 ට වැඩි කාලයක් තුළ නිරවුල් වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී බදුල්ල හා බණ්ඩාරවෙල ඩිපෝවන්හි ලැබිය යුතු ආදායම් ශේෂයන් පිළිවෙලින් රු. 2,917,799 ක් හා රු.2,415,070ක් පැවති අතර, මෙම මුදල් කාලයක් තුල අය නොවී පැවතුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 233,785,840 ක් වූ ලැබිය යුතු ආදායම් ශේෂය තුළ ඇතුළත් රු.187,514,112 ක ලැබිය යුතු අර්ථසාධක අරමුදල් ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි.

(ඊ) කොළඹ ප්‍රාදේශීය කාර්යාලය, බලංගොඩ හා අවිස්සාවේල්ල ඩිපෝවන්හි එකතුව රු. 29,109,121 ක් ද ලැබිය යුතු ආදායම් වසර 05 ත් 10 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි.

(උ) 2012 වර්ෂයට පෙර සිට පැවත එන දඹුල්ල හා මොණරාගල ඩිපෝවන්හි ලැබිය යුතු ආදායම් පිළිවෙලින් රු.3,609,145 ක් හා රු.11,076,232 ක් නිරවුල් නොවී පැවතුණි.

## 2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | සමාලෝචිත වර්ෂයේ, දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත් වල එකතුව රු. 479,094,484 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) 1981 අංක 26 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වගන්තිය | සෑම මාසයකම දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට පෙර සේවක අර්ථසාධක අරමුදල වෙත බැර කල යුතු වුවද ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන් වෙනුවෙන් දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,576,839,351 ක ගෙවිය යුතු ශේෂයන් පැවතුනි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය මගින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 62 කට අදාළ බැංකු සැසඳුම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 395 (ඉ) | බැංකු ගිණුම් 03ක එකතුව රු.9,179,791 ක් වූ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 395 (ඌ) | නිලධාරීන්ට රාජකාරී පැවරීමේදී මුදල් පොත පිළියෙල කිරීමට සම්බන්ධ නොවූ පුද්ගලයෙකුට බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ කාර්යය පැවරිය යුතු වුවත්, මණ්ඩලයේ සියලුම බැංකු ගිණුම්වල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ කාර්යය මුදල් පොත පවත්වාගෙන යනු ලබන නිලධාරීන් හට පවරා තිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 396(ඇ) | බැංකු ගිණුම් 14 කට අදාළ නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් ඉකුත් වී බැංකුවට ඉදිරිපත් නොකළ රු.5,029,620ක් වූ චෙක්පත් 67 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත | සමාලෝචිත වර්ෂයේදී රු. 775,655,613 ක් වටිනා වයර් ප්‍රසම්පාදනය.<br>------------------------------------------------------------ |
| | (i) 4.2.3 වගන්තිය | සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුලත් වන පරිදි ප්‍රසම්පාදන කාල සටහන යකස් කර නොතිබුණි. |
| | (ii) 5.3.11 වගන්තිය | ලංසු වලංගු කාලය අවසන් වූ දින සිට තවත් දින 14 ක් ලංසු සුරක්ෂණයේ කාලය වැඩිවිය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |
| | (iii) 5.4.8 වගන්තිය | භාණ්ඩ සැපයීම නිම කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් දක්වා කාර්යය සාධන සුරක්ෂණය වලංගු විය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (iv) 6.3.3 වගන්තිය | ලංසු විවෘත කිරීමේ කාර්යය පටිපාටිය අනුව ලංසු සුරක්ෂණ සහතිකයේ කෙටි අත්සන තැබීම ලංසු විවෘත කිරීමේ කමිටු සියලු සාමාජිකයින් විසින් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| | (v) 7.4 වගන්තිය | ලංසුවෙහි වලංගු කාලයෙන් සියයට පනහක කාලයක් ඇතුලත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාව සම්පූර්ණ කළයුතු වුවත් එසේ සිදුකර නොතිබීම. |
| | | සමාලෝචිත වර්ෂයේදී රු. 52,759,716ක් වටිනා දුනුකොළ ප්‍රසම්පාදනය. |
| | | ------------------------------------------------------------ |
| | (i) 5.3.2 වගන්තිය | ප්‍රසම්පාදන දැන්වීමේ ඇතුළත් කළයුතු මූලිකව වැදගත් වන කරුණු ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) 5.4.8 වගන්තිය | භාණ්ඩ සැපයීම නිම කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් දක්වා කාර්යය සාධන සුරක්ෂණය වලංගු විය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 29,063,501,009 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ මණ්ඩලය සතු වුවද එම සියලු වත්කම් ඇතුලත් වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඊ) | මධ්‍යම බස් නැවතුම්පළ කඩ කාමර බදු ගිවිසුම් අංක 05,14,08,09 වගන්ති | ජල බිල්පත්,විදුලි බිල්පත්,නියමිත පරිදි ගෙවා නොතිබීම. |

(ඇ) මණ්ඩලය හා සියළු සමාගම් සමග එළඹී ටයර් ප්‍රසම්පාදනය සම්බන්ධ ගිවිසුම

| | |
|---|---|
| (i) කොන්දේසි අංක 7.2 | ඇනවුම් කර සතියක් ඇතුලත භාර දිය යුතු වුවත්, එසේ භාර දී නොතිබුණු ටයර් ප්‍රමාද කාලය දින 16 සිට දින 180ක් දක්වා වූ කාල පරාසයක තිබුණි. |
| (ii) කොන්දේසි අංක 8 | කොන්දේසිය පරිදි ඇණවුම් කල භාණ්ඩ නියමිත පරිදි ලබා නොදීම නිසා පමා පොලිය අයකර නොතිබුණි. ඒ අනුව අංක 902 වවුචරය මගින් ඇනවුම් 04 ක් සඳහා රු. 734,751 ක පමා පොලී අයකරගෙන නොතිබුණි. |
| (iii) කොන්දේසි අංක 10.4 / 10.5 | නව ටයර් ක්‍රියාකාරීත්ව වාර්තා අනුව ධාවන කල යුතු කිලෝමීටර් ගණනට අඩුවෙන් ධාවනය කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කොන්දේසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 632,619,173 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.751,260,743 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.118,641,570 කින් අඩු වී තිබුණි. මණ්ඩලයේ ආදායම රු. 3,638,684,574 කින් වැඩි වී රජයේ ප්‍රදාන රු. 342,896,380 කින් වැඩිවීම ද, ඉහත ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌනතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වර්ධනය වී තිබූ අතර 2013 වර්ෂයේ දී රු. 12,709,377,743 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ දී රු. 19,538,760,465 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2016 වර්ෂයේ මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මට අනුව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ අයවැය ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතට අනුව මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කළ හැකි පහත දැක්වෙන කාර්යයන් සංයුක්ත සැලැස්ම සැකසීමේ දී අවධානය යොමු වී නොතිබුණි.

- මණ්ඩලය විසින් ප්‍රවාහනය කරනු ලබන මගීන් සඳහා බස් නැවතුම්පලවල් හෝ ආවරණ සැපයීම.
- ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල බස් සේවා සැපයීම.
- මණ්ඩලයට අයත් බස් රථ නැවතුම් ස්ථාන සපයාදීම සහ නඩත්තු කිරීම.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ලඟා කරගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i) කිලෝමීටරයකට මාර්ග ලේඛන ආදායම රු. මිලියන 65.5 ක් ඉපැයීමට ඉලක්ක කර තිබුණද 2016 වර්ෂය තුල සත්‍ය වශයෙන් උපයා තිබුණේ, කිලෝමීටරයකට මාර්ග ලේඛන ආදායම රු. මිලියන 57.59 ක් පමණි. ඒ අනුව ඉලක්කගත ආදායමෙන් රු. මිලියන 7.91 ක ආදායම් ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 වර්ෂයේදී දිනකට ඉපැයීමට අපේක්ෂිත සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම රු.මිලියන 87.06 ක් වුවත්, වර්ෂය තුල සත්‍ය වශයෙන් දිනකට උපයන ලද සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම රු.මිලියන 71.08 ක් වේ. ඒ අනුව රු. මිලියන 15.98ක ඉලක්කයක් ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පූර්ණ වශයෙන් අළුත්වැඩියා කළ යුතු බස් රථ හා දෛනිකව ඇතිවන සුළු අළුත්වැඩියා හේතුවෙන් ධාවනයෙන් ඉවත්වන බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට අරමුණු කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට පැවති මුළු බස් රථ ඇණිය 7,768 ක් වුවද පහත දැක්වෙන හේතු මත එම බස් රථ ඇණියෙන් බස් රථ 1,564 ක් හෙවත් සියයට 20 ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

| <u>විස්තරය</u> | <u>ධාවනය නොවන බස්රථ සංඛ්‍යාව</u> |
|---|---|
| ටයර්, ටියුබ් සහ බැටරි නොමැතිව නතර වූ බස් රථ | 111 |
| කට්ටල්, උපකට්ටල් නොමැතිව නතර වූ බස් රථ | 424 |
| නඩුගත සිදුවෙමින් පවතින බස් රථ | 85 |
| හදිසි අනතුරු අළුත්වැඩියාවේ පවතින බස් රථ | 55 |
| ධාවනය වීමේ දී ඇතිවන සුළු කාර්මික දෝෂ නිසා අළුත්වැඩියාවේ පවතින බස් රථ | 218 |
| කට්ටල් අළුත්වැඩියාවේ පවතින බස් රථ | 254 |
| විශාල අළුත්වැඩියා සඳහා නතර වී ඇති බස් රථ | 306 |
| අළුත්වැඩියාවෙන් ආර්ථික වාසි නොවන බස් රථ | 111 |
| **මුළු එකතුව** | <u>1564</u> |

බස් රථ වලින් 539 ක් ටයර්, ටියුබ් හා කට්ටල් නොමැතිවීම හේතුවෙන් ධාවනයට යොදවා නොතිබුණි. එමෙන්ම එම බස්රථ ඇණියෙන් 1008 ක් අවුරුදු 15කට වඩා පැරණි බස් රථ විය.

(ඈ) මණ්ඩලයේ 2016 වර්ෂය තුළ ධාවනයට ලබාදෙන බස් රථවලට අවශ්‍ය රියදුරු සංඛ්‍යාව (කාර්යයන් අනුව) 9,192 ක් හා කොන්දොස්තර සංඛ්‍යාව 9,192 ක් විය. සත්‍ය වශයෙන් සිටින රියදුරු සංඛ්‍යාව 9,954 ක් හා කොන්දොස්තර සංඛ්‍යාව 9,628 ක් විය. ඒ අනුව ධාවනයට ලබාදෙන ලද බස් රථවලට අවශ්‍ය රියදුරු සංඛ්‍යාව 762 ක් ද, කොන්දොස්තර සංඛ්‍යාව 436 ක් ද අතිරික්තව සිටින බවට නිරීක්ෂණය වූ නමුත් ප්‍රාදේශික හා ඩිපෝ අතර, අනුයුක්ත කිරීමේ විෂමතාවන් හේතුවෙන් ඇතැම් ප්‍රාදේශික වල හා ඩිපෝවල රියදුරු හා කොන්දොස්තර ඌනතා හා අතිරික්තතා පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත බස් රථ පුනරුත්ථාපනය කර රථ ඇණියට එක් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයට රු. මිලියන 800 ක් වෙන්කර තිබුණු අතර 2016 වර්ෂය තුළ දී රු. මිලියන 1084 ක් භාණ්ඩාගාරයෙන් ලැබී වියදම් කර තිබුණි. මණ්ඩලයේ සැලසුම් අංශයේ වාර්තා අනුව ඉලක්කගත ප්‍රමාණයෙන් බස්රථ 1539 ක් හෙවත් සියයට 65 ක් අළුත්වැඩියා කරගත නොහැකි වී තිබුණි. අපේක්ෂිත ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

**2016 වර්ෂය**

| විස්තරය | ඉලක්කය | සත්‍ය තත්වය | ලඟාකර ගැනීමට නොහැකි වූ ප්‍රමාණය |
|---|---|---|---|
| එන්ජින් කට්ටල් | 1200 | 419 | 781 |
| ගියර් පෙට්ටි | 900 | 195 | 705 |
| බස් බොඩි | 264 | 211 | 53 |
| එකතුව | **2364** | **825** | **1539** |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ කාර්යාලයේ කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් වූ කඩ කුලී බදු ගිවිසුම්හි 14 හා 16 වගන්ති ප්‍රකාරව බදු දීමනාකාර පක්ෂය විසින් මාසික බදු මුදල් ගෙවීම එක දිගට මාස 3 කට පැහැර හැරියහොත් මාස 3ක පූර්ව ලිඛිත දැනුම් දීමක් කොට එම බදුගිවිසුම අවලංගු කළ හැකිය. නමුත් මධ්‍යම බස් රථ කාර්යාලයේ එල් එච් 32 හා එල් එච් 34 දරණ කඩ කාමරය හා වැසිකිළි පද්ධතිය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.450,000 ක් හා රු. 1,978,000 ක බදු මුදල් හිඟව පැවති අතර, වර්ෂය තුළ දී එක දිගට මාස 3 කට වඩා කුලී මුදල් පැහැර හැර තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම බස්රථ කාර්යාලයේ කඩ කාමර 58 කින් 9ක් සඳහා පමණක් 2016 දෙසැම්බර් 31 දින වන විට බදු ගිවිසුම් වලංගුව තිබුණු අතර ඉතිරි බදු කුලී ගිවිසුම් යල් පැනගිය ඒවා බවත් ඒවායින් සමහර ගිවිසුම් 1970 වර්ෂයේ සිට පැවත එන ඒවත් නිරීක්ෂණය විය. මෙම බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2016 වර්ෂයේ මාසික කඩ කාමර කුලී මුදල් විවිධ රේට්යන් යටතේ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක 61 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සංශෝධනය කර තිබුණු අතර ඒ අනුව එම සංශෝධිත කුලී අය නොවන බවත්, නව මාසික කුලී ගාස්තුව තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය . 2015 දෙසැම්බර් 31 දිනට පැවති මාසික කුලී මුදල හා 2016 දෙසැම්බර් 31 දිනට පැවති මාසික කුලී මුදල අතර විචලනය සියයට 0 සිට සියයට 403 ක් දක්වා පැවතුණි. ඒ අනුව

(ඇ) විදුලි බල මණ්ඩලය හා ජල සම්පාදන මණ්ඩලය විසින් සැපයුම සඳහා ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තියට අනුව භාවිතා කරන ඒකක ප්‍රමාණය වැඩි වන විට වැඩි රේට්යකින් ගෙවීම් කිරීමට සිදු වේ.ඒ පිළිබඳව නොසලකා මධ්‍යම බස් රථ කාර්යාලය විසින් බදු දී ඇති කඩ කාමර සඳහා සවි කර ඇති උප ජල හා උප විදුලි මීටර් මඟින් භාවිතා කරන ඒකක සඳහා සමාන රේට්යක් යටතේ බදුකරුවන්ගෙන් ගාස්තු අය කර තිබුණි.තම හේතුවෙන් පහත සඳහන් පරිදි 2016 වර්ෂය සඳහා ජල හා විදුලි බිල්පත් වශයෙන් බදුකරුවන්ගෙන් අය කල ගාස්තු වලට වඩා රු.12,117,837ක් මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි.

| | 2016 වර්ෂයේ බදුකරුවන්ගෙන් අයකර ඇති මුදල | 2016 වර්ෂයේ මණ්ඩලය ගෙවා ඇති මුදල | 2016 වර්ෂයේ අයකළ මුදලට වඩා ගෙවා ඇති මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විදුලිය | 2,520,495 | 9,156,041 | 6,635,546 |
| ජලය | 1,197,133 | 6,679,424 | 5,482,291 |
| එකතුව | 3,717,628 | 15,835,465 | 12,117,837 |

(ඉ) මධ්‍යම බස් රථ කාර්යාලයේ අංක ඊල්එච් 32 දරන කඩ කාමරය වර්ග අඩි 4,788 කින් යුක්ත විය. බදුකරු විසින් එය වායුසමනය කරන ලද කාමර 10 ක් පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබුණි. ඒ ස්ථානයට ලබා දී තිබූ කොකලා විදුලි සැපයුම සඳහා 2016 වර්ෂයේ අයකර තිබූ විදුලි ගාස්තුව රු.175,815 ක් වුවත් , එහි විදුලි බිල්පත වශයෙන් මණ්ඩලය කොපමණ මුදලක් ගෙවා තිබුණි ද යන්න හඳුනා ගත නොහැකි වූ අතර මෙම අවාසිදායක ගාස්තු ප්‍රතිපත්ති හා ගිවිසුම්ගත කොන්දේසි සංශෝධනයට පියවර ගෙන නොතිබුණි.

(ට) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අක්‍රිය හිඟුවී ශේෂ සපා හැරීම සඳහා කමිටුවක් පත් කිරීමට 2016 ජනවාරි තීරණය කර තිබුණි.ඒ සඳහා අමාත්‍යාංශ හා භාණ්ඩාගාර නියෝජිතයෙකු පත් කිරීම 2017 ජනවාරි දක්වා වර්ෂයක් ප්‍රමාද වී තිබුණු අතර 2018 අප්‍රේල් අවසන් වන විටත් අදාළ කමිටුව විසින් ඒ සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඩ) ලංසු ලේඛනවල සඳහන් අතිරේක අවශ්‍යතා යටතේ ටයර් සපයන ආයතනය විසින් ටයර්වල නිෂ්පාදිත අනුක්‍රමික අංකය සඳහන් කළ ටයර් කාඩ්පතක් සෑම ටයරයක් සඳහාම ශ්‍රී ලංගමය වෙත නිකුත් කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා සියළු සමාගමෙන් මිලදී ගත් ටයර් 19,094 ක් වෙනුවෙන් ටයර් කාඩ්පත් සපයා නොතිබුණි.

(ඪ) මණ්ඩලය විසින් 2016 වර්ෂය සඳහා ටයර් මිලදී ගැනීමට සියළු කැලණි ජාත්‍යන්තර ටයර් සමාගම සමඟ 2016 මැයි මස 06 වන දින ගිවිසුමකට එළැඹ තිබූ අතර ඉන් පරිබාහිරව වෙනත් සමාගම් වලින් රු. 2,071,847ක් වටිනා නව ටයර් 34ක්, කරපටි 1925ක් හා ටියුබ් 195ක් මිලදී ගෙන තිබුණි.

(ත) ඩිපෝවලට අයත් බස් රථ සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේදී ප්‍රධාන කාර්යාල මගින් සැපයුම්කරුවන් තෝරාගෙන පසුගිය වර්ෂයන්හිදී ගෙවීම් සිදුකර තිබුණි. එහෙත් සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සපයා තිබූ අමතර කොටස්වලට අදාල ඉන්වොයිස් පත් හා ඩිපෝ ගබඩාවට භාණ්ඩ ලද බවට සහතික, ඩිපෝ විසින් ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු.1,907,294,471 හා 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,635,847,558 ක් වශයෙන් නොපියවූ ශේෂයක් වූ අතර අත්තිකාරම් නිරවුල් කිරීම ප්‍රමාදයකින් තොරව සිදු නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

(ථ) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ තිල වාහන ලොග්පොත්, Repair Kit Injector Pump ඇතුලුව ගබඩා අයිතම 140 ක් පාවිච්චි කිරීමට නුසුදුසු වුවද කලාතුරකින් නිකුත්වන භාණ්ඩ ලෙස 2016 දෙසැම්බර් 31 දිනට වූ ගබඩා සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව හඳුනාගෙන තිබූ අතර එහි වටිනාකම රු. 17,159,995 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව හෙළිදරව්කර නොතිබුණි.

(ඔ) ප්‍රධාන කාර්යාලයේ පමණක් විවිධ අරමුණු වෙනුවෙන් ජංගම ගිණුම් 21 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර හර එකතුව රු.6,822,431,518 ක් හා බැර එකතුව රු.6,815,368,696 ක් වශයෙන් ගිණුම් අතර මුදල් හුවමාරුකර තිබුණි. ඒ අනුව මූල්‍ය කටයුතු පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කතරගම විශ්‍රාම ශාලාවේ අදියර 02 හි ඉදිකිරීම් පිරිවැය රු. 13,167,038 ක් වූ අතර එම ඉදිකිරීම් පිරිවැයෙන් රු. 7,912,368 ක් ගෙවා තිබියදී කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව රු. 658,351 ක කාර්යසාධන බැඳුම්කරය 2013 දෙසැම්බර් 08 දින කල් පිරී තිබුණු අතර එය කල් පිරීමට පෙර මුදල්කර නොගැනීම නිසා ආයතනයට සිදු වූ පාඩුව සම්බන්ධව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රියදුරු පුහුණු පාසල් වාර්ෂිකව පාඩු ලබමින් පවත්වාගෙන ගොස් තිබුණි. ඒවා සඳහා රියදුරු උපදේශකයින්ට සාපේක්ෂව අනිකුත් කාර්ය මණ්ඩලය අතිරික්ත ලෙස අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් එම රියදුරු පුහුණු පාසල්වල ආදායම ඉක්මවා වැටුප් හා දීමනා ගෙවීමට සිදු වී තිබුණි. පොතුහැර හා කළුතර රියදුරු පුහුණු පාසල්වල 2016 වර්ෂයේ ආදායම , වැටුප් ගෙවීම් හා අනුයුක්ත නිලධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රියදුරු පුහුණු පාසල පොතුහැර | රියදුරු පුහුණු පාසල කළුතර |
|---|---|---|
| | රු. | රු. |
| 2016 වර්ෂයේ අලාභය | 21,192,032 | 32,629,646 |
| 2016 වර්ෂයේ ආදායම | 8,769,875 | 7,617,748 |
| 2016 වර්ෂයේ වැටුප් හා දීමනා ගෙවීම් | 14,077,682 | 21,494,112 |
| අනුයුක්ත මුළු කාර්ය මණ්ඩලය | 21 | 33 |
| අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සිටින උපදේශකවරු සංඛ්‍යාව | 04 | 06 |

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.97,462,160 ක් වූ බස්රථ 143 ක් 2002 වර්ෂයේදී වෙස්ටෙක් ආයතනයට පුනරුත්ථාපනය කිරීම සඳහා යවා තිබුණි. එහෙත් වෙස්ටෙක් ආයතනය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින බැවින් අදාළ බස්රථ නැවත මණ්ඩලයට ගෙන්වා ගැනීම පිළිබඳ අවදානමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තොරතුරු අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.3,695,712,194 ක් සේවක අර්ථසාධක අරමුදලට සේවක දායක මුදල් වශයෙන් සේවක වැටුපෙන් අයකර ඇතත් එම මුදල් නියමිත පරිදි සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම නිසා අදාළ කාලයට ලැබිය යුතු පොළී ප්‍රමාණය සේවකයන් වෙත ලැබී නොතිබුණි.

**4.5 දූෂණ අක්‍රමිකතා**

2012 සිට 2015 වර්ෂය දක්වා සමාගමක් විසින් ශ්‍රී ලංගමය සතු ඩිපෝ සඳහා නැප්කෝ නාමය යටතේ නිෂ්පාදිත දකුණුකොළ සැපයුම්කරුවන් විසින් මණ්ඩලයට සපයා නොතිබියදී සැපයුම් කර ඇතිබව සඳහන් කරමින් එම ආයතනයට අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අනුව මණ්ඩලය විසින් මුදල් රු. 127,150,000 ක් ගෙවීම්කර තිබුණි. මුදල් රෙගුලාසි 137 හා 138 පරිදි දුනු කොළ ලැබුණු බව තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම්කර ඇතත් අදාල නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට හා අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. .

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂ වල කල්බදු පදනම මත මිලදී ගන්නා ලද එක් බස්රථයක් සඳහා දිනකට රු.3,000 බැගින්, ඩිපෝ වෙතින් ප්‍රධාන කාර්යාලයට මුදල් ප්‍රේෂණය කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ඩිපෝ වෙතින් රු. 1,541,834,030 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ආ) ඩිපෝ විසින් මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලය විසින් බස්රථ කල්බදු වාරික ගෙවීම ප්‍රමාද කර තිබූ අතර, ඒ සඳහා රු.67,076,082ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) කල්බදු වාරික හා ප්‍රමාද ගාස්තු ගෙවීමට ප්‍රමාණවත් මුදල් මණ්ඩලයට නොවීම නිසා 2016 වර්ෂය තුළදී රු. 770,542,961 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ණය සඳහා පොලී වශයෙන් මණ්ඩලය විසින් රු.43,587,110 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.7 හඳුනාගන්නා ලද පාඩු

සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට පිළිවෙලින් රු. 143,942,364 ක් හා රු.3,798,120 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්,බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 11 ක් ප්‍රමාද වී එනම් 2018 ජනවාරි 23 දිනයේදීය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ළඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද,4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඊට අනුකූලව සකස් කර නොතිබුණි.

(ආ) 2016 ප්‍රසම්පාදන සැලැස්මට අනුව පහත පරිදි ටයර් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද සත්‍ය මිලදී ගැනීම හා සැසඳීමේදී අඩුවෙන් මිලදීගෙන තිබූ අතර එය සියයට 56 සිට සියයට 100 දක්වා පරාසයක තිබුණි.

| ටයර් වර්ගය | ප්‍රසම්පාදන සැළැස්ම අනුව ටයර් සංඛ්‍යාව | සත්‍ය තත්ත්වය ටයර් සංඛ්‍යාව | වෙනස | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 750x16 | 72 | - | 72 | 100% |
| 825x20 | 4,800 | 1,074 | 3,726 | 78% |
| 900x20 | 36,000 | 15,924 | 20,076 | 56% |
| 1000x20 | 912 | 202 | 710 | 78% |
| එකතුව | **41,784** | **17,200** | **24,584** | |

## 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2016 වර්ෂයට පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ තොරතුරු හා 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු සැසඳීමට නොහැකි පරිදි එකිනෙකට වෙනස් ආකාරයට පිළියෙල කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පවතින්නේ ද යන්න සොයා බැලීමක් සිදු නොකරන බවත් හා එය ආයතනයේ මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බවට නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ආදායම් සහ වියදම් අයිතමයන් 15 ක අයවැයගත වටිනාකම් සහ සත්‍ය වටිනාකම් අතර සියයට 11 සිට සියයට 101 දක්වා විචලනයන් නිරීක්ෂණය වූහෙයින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තියට අනුව දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටකිරීමත්, තැන්පත් කිරීමත් හෝ මෝචනය කිරීමෙන් කෙරෙන සෑම කටයුත්තක් සඳහාම ඉහත වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු වේ. එම ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලබන සෑම මෝටර් වාහනයක්ම වායු විමෝචන පරීක්ෂාවට ලක් කර අනුකූලතා සහතිකයක් ලබා ගත යුතු වන අතර නියෝග අංක 09 ට අනුව මෝටර් වාහනය යන්නට බස්රථ ද ඇතුළත් වන බව සඳහන් වී ඇති බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද වායු විමෝචන සහතික ලබාගත යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල 10 ක තොරතුරු අනුව 2016 වර්ෂයේ මුළු බස්රථ 6729 කින් බස්රථ 800 ක් පමණක් වායු විමෝචන සහතික ලබා ගෙන තිබුණි. ඒ අනුව මුළු බස්රථ සංඛ්‍යාවෙන් සියයට 88 ක් දුම් සහතික ලබා ගැනීමකින් තොරව ධාවනය කිරීම නිසා පාරිසරික නීති රෙගුලාසි උල්ලංඝනය වී ඇති බවත් නිරීක්ෂණය වේ.

(ආ) සියලුම වාහන සේවා කටයුතු සිදු කරන ඩිපෝ විසින් ඊට අදාළව බලපත්‍රයක් ලබා ගත යුතු බව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හා 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අනුව දක්වා තිබුණද, ශ්‍රී ලංගමයේ ඩිපෝ 107 කින් ඩිපෝ 07 ක් පමණක් මෙම බලපත්‍රය ලබා ගෙන ඇති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම. |
| | (ii) වත්කම්වල ආරක්ෂාව ඇතිවන පරිදි භාරකාරත්වය නොපැවරීම. |
| | (iii) වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම. |
| | (iv) වාර්ෂික සත්‍යාපනයන් නොකිරීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම. |
| | (ii) මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව බැංකු ගිණුම පවත්වාගෙන යාම |
| | (iii) නිවැරදි ලෙස බැංකු සැසඳුම් පිළියෙළ නොකිරීම |

(ඈ) අත්තිකාරම් පියවීම

(i) අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම

(ii) ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම.

(iii) වගකිව යුතු නිලධාරියෙකු විසින් අධීක්ෂණය නොකිරීම.

(iv) කාලීන සැසඳීම් හා පියවීම් නොකිරීම.

(ඉ) ගබඩා පාලනය

(i) ගබඩාවට ලැබෙන භාණ්ඩ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් නොවීම.

(ii) දීර්ඝ කාලයක සිට පැවතෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු නොකිරීම.

(iii) ප්‍රධාන කාර්යාලයෙන් ඇණවුම් කර සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සෘජුව ලබා දී තිබූ භාණ්ඩ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට වාර්තා නොකිරීම හා සැසඳීම් නොකිරීම.

(iv) ගබඩා දත්ත හා ඩිපෝවල දත්ත සැසඳීම් නොකිරීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති